# 2016

# අයවැය කථාව

## උතුරු මැද පළාත් සභාව

පේශල ජයරත්න බණ්ඩාර,
ප්‍රධාන අමාත්‍ය,
උතුරු මැද පළාත් සභාව,
2015 දෙසැම්බර් මස 21 දින.

## 1.0 හැඳින්වීම

1.1 ගරු සභාපතිතුමනි, 1988 මැයි මස12වන දින පිහිටුවන ලද උතුරු මැද පළාත් සභාවේ හයවන(06) මුදල් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් හයවන(06) පළාත් සභාවේ හතරවන (04) මුදල් ප්‍රකාශය මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් නිර්මාණය කිරීමට අපේක්ෂා කරනු ලබන "යහපත් ආර්ථික ශක්තියකින් හෙබි, යහගුණයෙන් සපිරි සදාචාර සම්පන්න සමාජයක් හා යහපාලනයට පරමාදර්ශයක් වන රටක්" නිර්මාණය කිරීමේ දැවැන්ත කාර්යය සඳහා මෙම පළාත් සභාවේ දායකත්වය ලබාදීමට හැකිවීම මා භාග්‍යක් කොට සලකනවා.

1.2 ගරු සභාපතිතුමනි, 1987 වර්ෂයේ සම්මත කරන ලද දහතුන්වන (13) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එවකට මධ්‍යගත වී තිබූ බලය පළාත් සභා අතර බෙදා හරිනු ලැබුවා. ඒ තුළින් රටතුළ තුලා ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීම එක් අරමුණක් වුණා. පළාත්වල ඒකපුද්ගල ආදායම වැඩිකිරීම, පළාත් අතර ආර්ථික සහ සාමාජ්‍ය විෂමතා ක්‍රමිකව අඩුකිරීම පළාත් සභා ක්‍රමය තුළින් බලාපොරොත්තු වුණා. නමුත් ගෙවී ගිය අවුරුදු විසහතක (27) කාලය තුළ එම අරමුණු කරා ළඟාවීම සිදු වුයේ ඉතා මන්දගාමීවයි. 2012-2013 ශ්‍රී ලංකා මහබැංකු වාර්තාවට අනුව දළ ජාතික නිෂ්පාදිතයට 2008 වර්ෂයේදී උතුරු මැද පළාතෙන් දක්වන ලද දායකත්වය සියයට හතරයි දශම හතක් (4.7) වූ අතර, දෙදාස් දොළහ (2012)වර්ෂය දක්වා වූ කාලය තුළ කිසිදු වැඩිවීමක් සිදුවී නැහැ. පළාතේ ඒකපුද්ගල ආදායමේ අපේක්ෂිත පරිදි වර්ධනයක් සිදු වුයේ නැහැ. ඒ නිසා අප බලාපොරොත්තු වූ පරිදි පළාත් අතර ආදායම් බෙදී යාමේ විෂමතාවය අඩු වුයේ නැහැ. ඊට ප්‍රධාන හේතු වශයෙන් අප දකින්නේකෘෂිකර්මය, කුඩා කර්මාන්ත වැනි උතුරු මැද පළාතේ විභවතාවයක් ඇති ක්ෂේත්‍ර අතර බෙදී ගිය ප්‍රතිපාදන අඩුමට්ටමක පැවතීමයි. ග්‍රාමීය මට්ටමේ ව්‍යවසායකත්ව කණ්ඩායම් වල ආදායම් උත්පාදක ක්ෂේත්‍ර සඳහා දක්වන ලද අවධානය අඩු මට්ටමක පැවතුනා. නමුත් මෙවර අයවැයෙන් එවැනි බොහෝ ක්ෂේත්‍ර සඳහා වැඩි

ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා.

1.3 ගරු සභාපතිතුමනි, මෙවර අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේදී පළාතේ ආර්ථික හා සාමාජ්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගනු ලැබුවා. ඊට අමතරවමෙම අයවැය සකස් කිරීමේදී පළාත් සභාවේ මහජන නියෝජිතයන්ගේ, විද්වතුන්ගේ, ගොවීන්ගේ, වෘත්තීය සමිති සහ නිලධාරීන්ගේ අදහස් ද සැලකිල්ලට ගත්තා. අයවැය කමිටුව කිහිපවාරයක්ම රැස්වී පළාතට අවශ්‍ය ප්‍රමුඛ යෝජනා පෙළගැස්වූවා. ඒ අනුව මෙම අයවැය අප සියළු දෙනාම එක්වසකස් කළ අයවැයක් විදියටයි මා දකින්නේ. මෙම සියළු අදහස්දසැලකිල්ලට ගෙන කෘෂිකර්මය, අධ්‍යාපනය, සෞඛ්‍යය, ග්‍රාමීය යටිතල පහසුකම්, සාමාජීය ආරක්ෂණය වැනි ක්ෂේත්‍ර සඳහා විශේෂ බරක් තැබුවා. පළාතේ තුළිත ආර්ථික සංවර්ධනයක් (Balance Economic Development) ඇති කර ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සෘජුවම දායක වන සංවර්ධන සාධක කෙරෙහි විශේෂ අවධානය යොමු කර දෙදහස් දහසය (2016) වර්ෂයට වෙන්කර දීමට යෝජිත ප්‍රතිපාදන සහ අයවැය යෝජනා මෙතැන් සිට මා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

## 2.0 කෘෂිකර්මය

2.1 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතේ ජීවත්වන දොළොස්ලක්ෂ හැත්තෑ දහසක් වන මුළු ජනගහණයෙන් සියයට හැත්තෑනවයක (79%) පමණ ප්‍රධාන ආදායම් මාර්ගය වී ඇත්තේකෘෂිකර්මාන්තයයි.ඒනිසා කෘෂිකර්මය ආශ්‍රිතව ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අවශ්‍ය සාධක කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා. එමෙන්ම අතිගරු ජනාධිපතිතුමා විසින් ක්‍රියාත්මක කරනු ලබන දේශීය ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට දායක වන පරිදි උතුරු මැද පළාත තුළ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. එම වැඩසටහනට අනුව ආහාරභෝගනිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම, පශු සම්පත් සංවර්ධනය, මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය වැඩි කිරීම, පළාතට ගැලපෙන වැවිලි භෝග ප්‍රවර්ධනය සඳහා මෙම අයවැයෙන් රුපියල් මිලියන දෙසිය දාහතරක (රු.මි.214) ප්‍රතිපාදන වෙන් කර දී

තිබෙනවා.පසුගිය වර්ෂයේ වෙන්කරන ලද ප්‍රතිපාදන හා සසඳන විටඑම ප්‍රමාණය සියයට හැට දෙකයි දශම හතයි තුනක (62.73%) වැඩිවීමක් ලෙසසටහනක් තබන්නේ ඉතාමත් සතුටිනි.එසේම ජනාධිපති කාර්ය සාධන මෙහෙයුම් වැඩසටහන යටතේ දෙදහස් දහසය (2016)වර්ෂය වෙනුවෙන් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සඳහා අතිරේක ප්‍රතිපාදන මෙම පළාතට ලැබේ යැයි මා විශ්වාස කරනවා.

2.2 ගරු සභාපතිතුමනි, අපේ රටේ නිෂ්පාදනය කළ හැකි විවිධ ආහාරභෝග විදේශ රටවලින් ආනයනය කිරීම සඳහා වාර්ෂිකව රුපියල් බිලියන තුනක(රු.බි.03) පමණ විදේශ විනිමයක් වැය කරනවා. විශේෂයෙන් බඩඉරිඟු, රටකජු, මුං, සෝයා, ලොකු ළූණු, මිරිස්, තල, උඳු, කවුපි, කුරක්කන් වැනි අතිරේක ආහාරභෝග නිෂ්පාදන උතුරු මැද පළාතෙන් දේශීය වෙළඳපළට වැඩි වැඩියෙන් ලබාදීමෙන් විදේශ රටවලට ගලායන විනිමය ඉතිරි කර ගැනීම සඳහා දායක වීමට අපට පුළුවන්. උතුරු මැද පළාතේ දායකත්වය වැඩිකිරීම සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙළක අවශ්‍යතාවය පවතිනවා. එබැවින් එහි පළමු පියවර වශයෙන් පෙර සඳහන් කරන ලද බෝග වර්ග නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙවර අයවැයෙන් රුපියල් මිලියන හැත්තෑවක් (රු.මි.70) වෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඉන් රුපියල් මිලියන තිස් හයක් (රු.මි.36) අනුරාධපුර දිස්ත්‍රික්කයටත් රුපියල් මිලියන විසි හතරක් (රු.මි.24) පොළොන්නරු දිස්ත්‍රික්කයටත් වෙන් විය යුතු යැයි මා යෝජනා කරනවා.

2.3 ඒ වගේම පළතුරු, එළවළු, කළු බුලත්, ගම්මිරිස් හා මල් වගාවවැනි කෘෂි නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපොළෙහි ලොකු ඉල්ලුමක් පවතිනවා. උතුරු මැද පළාතෙන් එම ඉල්ලුම සැපයීම සඳහා විශාල දායකත්වයක් ලබාදිය හැකියි. "එක් ගමකට එක වගාවක්" යන සංකල්පය මත පදනම්ව කෘෂි ගම්මානවැඩසටහනකට අනුව විදේශ වෙළඳපොළඉලක්ක කරගෙනවාණිජ වගා ක්ෂේත්‍රයේ නියුතුකුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැලසීම පිණිස රුපියල් මිලියන හතළිස් හයක් (රු.මි.46) වෙන් කිරීමට මා යෝජනා කරනවා.මෙම ක්‍රියාවලිය තුළින්විදේශ විනිමය මෙම පළාතට ගලා ඒමෙන් ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස්වේයැයි මා විශ්වාසකරනවා.

2.4 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතේ ඉඩම් භාවිතය කාර්යක්ෂම කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ මා සලකනවා. වර්ෂා පෝෂිත ඉඩම්වල,කහ, ඉඟුරුවැනි බෝගවගාවන් ප්‍රචලිත කිරීමටත් සුළු වාරි ඉඩම්වල අතරමැදි කන්නයක් ලෙස මුං, සෝයා වැනි ධාන්‍ය හා වෙනත් යෝග්‍ය භෝග වගාව ප්‍රවර්ධනය සඳහා ගොවීන් උනන්දු කළ යුතු වෙනවා. ඒසඳහා රුපියල් මිලියන විසිපහක (රු.මි.25) ප්‍රතිපාදන වෙන් කරදීමට මා යෝජනා කරනවා.

2.5 ගරු සභාපතිතුමනි, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහාත් පසෙහි ජීවිතාවය දිගින් දිගටම පවත්වා ගෙන යාම තුළින් පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයට ගොවීන් යොමු කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස මා සලකනවා. ඒසඳහා පළාත තුළ කාබනික පොහොර භාවිතයෙන් ගෙවතු වගා දිරි ගැන්වීම සඳහා රුපියල් මිලියන හතරක (රු.මි.04) ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

2.6 ගරු සභාපතිතුමනි, කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා නිරන්තර පර්යේෂණයන් සිදු කිරීම සහ බීජ වර්ග සහතික කිරීම ඉතාම අත්‍යවශ්‍යයි. දැනට මෙම පළාත ඇතුළු මුළු රට තුළසීඝ්‍රයෙන් පැතිර යන වකුගඩු රෝගයට රසායනික තෙල් හා පොහොර භාවිතය හේතු වන බව මේ පිළිබඳ පර්යේෂණ කළ විශේෂඥයින් විසින් මතපල කර තිබෙනවා. දශක කිහිපයක සිට අප රට තුළ සිදුවූ වැරදි සහගත කෘෂිකාර්මික භාවිතය මීට හේතුවයි. විශේෂයෙන්ම රසායනික තෙල් සහ පොහොර භාවිතයත් දේශීය බීජ පරම්පාරවන් වෙනුවට විදේශිය බීජ පරම්පරාවන් අප රට තුළ ප්‍රචාරණය වීමත් මීට ප්‍රධාන වශයෙන් හේතු කාරණා වී ඇති බව විද්වතුන් විසින් පෙන්වා දී තිබෙනවා. රට කාලීන පිළිතුරක් ලෙස දේශීය බීජ පිළිබඳ පර්යේෂණ කරමින් අපේ ගොවියාට ඉතා නිවැරදි කෘෂිකාර්මික දැනුමක් ලබාදීම සඳහා දේශිය කෘෂිකර්මය මුල් බැස්සවීම සඳහා අපේ රටට හිතකර වූ නවවැඩිදියුණු කළ බීජ වර්ග නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ කිරීමටත්, ආහාර සුරක්ෂිතතාවය හා කෘෂිකර්මාන්තය හා බැඳුණු සෞඛ්‍යමය ගැටළු හඳුනාගැනීම වැනි කාරණා සඳහා පර්යේෂණ සිදු කිරීමට පර්යේෂණායතනයක් නොමැතිවීම විශාල අඩුපාඩුවක් බව පළාතේ ගොවි මහතුන් හා ගොවි

සංවිධාන විසින් නිරන්තරයෙන් කරුණු අවධාරනය කර සිටිනවා.එම ඉල්ලීම සලකා බලා මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතන භූමියේ කෘෂි පර්යේෂණ ආයතනයක් පිහිටුවීම සඳහා මෙවර අයවැයෙන් රුපියල් මිලියන තිහක (රු.මි.30) මුදලක් වෙන් කිරීමට මා යෝජනා කරනවා. ඊට අමතරව මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය ගොවීන් පුහුණු කිරීම හා ගොවිපල සංවර්ධන විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) මෙවර අයවැයෙන් වෙන් කිරීමටත් මා යෝජනා කරනවා.

2.7 ගරු සභාපතිතුමනි, ලොකු ළූණු මෙම පළාතේ ප්‍රචලිත හා ලාභදායි වගාවකි. ලොකු ළූණු වගා කරන ගොවීන් සමඟ සාකච්ඡා කිරීමේදී ඔවුන් කියා සිටියේ බීජ අල වසන්තීකරණය කිරීමේ ගැටළුවක් ඇති බවයි. බීජ අල වසන්තීකරණය කිරීමට සෙල්සියස් අංශක දාහතරක (14) පමණ අඩු උෂ්ණත්වයක සති දෙකක් තැබිය යුතු වෙනවා. නමුත් එම උෂ්ණත්ව තත්වය මෙම පළාතේ නොමැති නිසා දැනට සිදු කරනු ලබන්නේ මේ අල කිලෝ එක්ලක්ෂ පනස්දාහක ප්‍රමාණයක් වසන්තීකරණය කිරීම සඳහා නුවරඑළියට රැගෙන යාමයි. ඒසඳහා විශාල වියදමක් සහ කාලයක් දැරිය යුතු වෙනවා. එබැවින් ලොකු ළූණු ගොවීන්ගේ ඉල්ලීම මත ලොකු ළූණු බීජ වසන්තීකරණය කිරීම සඳහා උතුරු මැද පළාතේ ශීතාගාර දෙකක් ඉදිකර ඊට අවශ්‍ය පහසුකම් සැලසීමට මෙවර අයවැයෙන් රුපියල් මිලියන දහයක (රු.මි.10) ප්‍රතිපාදන වෙන්කිරීමට මා යෝජනා කරනවා.

2.8 ගරු සභාපතිතුමනි, දැනට කාලගුණයේ පවතින වෙනස්කම් නිසා නොවැම්බර්, දෙසැම්බර් මාසවල එළවළු මිළ විශාල ලෙස ඉහළ යැමට ලක්වන බවඅප ඉතා හොඳින් දන්නා කරුණක්.ඊට ප්‍රධාන හේතුව එම කාලය තුළ පවතිනඅධික වර්ෂාව නිසාවගා හානි වීමයි. එයට හොඳම විසඳුම ලෙස කෘෂි විද්‍යාඥයින් විසින් පෙන්වා දෙන්නේ වැසි ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගාවසඳහා ගොවීන් යොමු කළ යුතු බවයි. එබැවින් උතුරු මැද පළාත තුළ වැසි ආවරණ ගෘහ ඉදිකිරීම සඳහා ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැලසීමට රුපියල් මිලියන හතරක(රු.මි.04) ප්‍රතිපාදන වෙන් කරනු ලබනවා.

2.9 ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කෘෂි ව්‍යාප්ත සේවය ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කරනු ලබනවා. ඒසඳහා උතුරු මැද පළාත තුළ කෘෂි ව්‍යාප්ත කාර්යාල නොමැතිවීම ගොවීන්ට හා නිලධාරින්ට ගැටළුසහගත බැවින් ගොවීන්ට අවශ්‍ය සේවාවසැපයීම වෙනුවෙන් නිලධාරින්ට අවශ්‍ය කාර්යාල පහසුකම් සැපයීම සඳහා කෘෂිකර්ම උපදේශක කාර්යාල හයක් (06) පිහිටුවීම වෙනුවෙන් මෙවර අයවැයෙන් රුපියල් මිලියන විසි හතක් (රු.මි.27) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

## 3.0 පශු සම්පත් සංවර්ධනය

3.1 ගරු සභාපතිතුමනි, ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලබා දෙන දායකත්වය අති විශාලයි. රටේ කිරි නිෂ්පාදන අවශ්‍යතාවය ලීටර් මිලියන හත්සිය පණහක් (ලී.මි.750) පමණ වනවා. රටේසාමාන්‍ය කිරි නිෂ්පාදනය ලීටර් මිලියන තුන්සිය තිස් හතරක් (ලී.මි. 334) පමණ වෙනවා. ඉන් උතුරු මැද පළාත කිරි ලීටර් මිලියන තිස් හයක (ලී.මි.36) එනම් සියයට දහයයි දශම හතයි හතක (10.77%) දායකත්වයක් ලබා දෙනවා.වාර්ෂික රටේ කිරි නිෂ්පාදන අවශ්‍යතාවයෙන් රටක් විදියට අපට සපුරාගත හැකිවී ඇත්තේ සියයට හතළිස් හතරයි දශම පහක ප්‍රමාණයක් පමණයි. එමනිසා කිරි නිෂ්පාදනයේ ඇති වී ඇති රික්තය පිරවීම සඳහා පළාතට සුවිශේෂී වූ ඉඩප්‍රස්ථාවන් ඇති බව පෙනී යනවා.

3.2 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් කිරි ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට මෙන්ම රටේ ජාතික නිෂ්පාදනයට පළාතෙන් දෙන දායකත්වය වැඩි කිරීමට හැකි වෙනවා. රටේ නිෂ්පාදනය වැඩිකිරීමටත් ආදායම් විභවතාවයන්ඇති කිරීමටත් ඉඩප්‍රස්ථාවසැලසෙනවා. එබැවින් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් ගොවිපලවල් හතළිහ බැගින් තෝරාගෙන එම ගොවිපලවලට තාක්ෂණ සේවා සැපයීම සහ කිරි ගොවීන්ට පහසුකම් සැපයීමසඳහා රුපියල් මිලියන විස්සක (රු.මි.20) ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා. ඒ තුළින් එක් ගොවිපලක දෛනික කිරි

නිෂ්පාදනය ලීටර් දහය (ලී.10) බැගින් ඉහළ නැංවීමටත් පළාතේ වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන හතරයි දශම දෙකක (ලී.මි.4.2) ඉහළ යාමක් ද අපේක්ෂා කරනවා. ඒ තුළ පළාතට අළුතින් එකතුවන වාර්ෂික ආදායම රුපියල් මිලියන දෙසිය පණහක් (රු.මි. 250) වේයැයි අපේක්ෂා කරනවා.

3.3 ගරු සභාපතිතුමනි,අතිගරු ජනාධිපතිතුමා විසින් ක්‍රියාත්මක කරන ජාතික ආහාර වැඩසටහන යටතේ සත්ව ප්‍රෝටීන පරිභෝජනය සියයට හතළිහකින් (40%) වැඩිකිරීමට සැලසුම්කර තිබෙනවා. එම සැලසුම් ක්‍රියාවට නැංවීමේදී රට දායකත්වය ලබාදීම සඳහා උතුරු මැද පළාත සුවිශේෂ වූ කාර්යභාරයක් ඉටුකළ යුතු වෙනවා. උතුරු මැද පළාතෙන් දැනට බිත්තර මිලියන තිහක් (මි.30) පමණ ජාතික නිෂ්පාදනයට එකතු කරනවා. එසේ ජාතික නිෂ්පාදිතයට කරන එකතුව මුළු නිෂ්පාදිතයෙන් සියයට එකයි දශම තුනයි හතරක් (1.34%) පමණ වෙනවා. ඒ වගේම කුකුල්මස් මෙට්‍රික් ටොන් හාරදහස් අසූපහක්(මෙ.ටො.4085) ජාතික නිෂ්පාදනයට මෙම පළාතෙන් එකතු කරනවා. එය ජාතික නිෂ්පාදිතයෙන් සියයට දෙකයි දශම හතක් (2.7%) වෙනවා. 2016 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය සියයට දහයකින් ද (10%) කුකුල්මස් නිෂ්පාදනය සියයට පහකින්ද (5%) වැඩිකිරීමට අපේක්ෂා කරනවා. මේ සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් තිස්දාහක් (30,000) දෙදහස් දහසය (2016) වර්ෂයේ පළාතේ ගොවීන් අතර බෙදා දීමට හැකිවන පරිදිතිරප්පනේ සත්ව ගොවිපල සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන තිස්හයක් (රු.මි.36) ලබාදීමට යෝජනා කරනවා.එම ව්‍යාපෘතියෙන් ගෘහාශ්‍රිත බිත්තර නිෂ්පාදන කර්මාන්තයේ ඉහළ යෑමක් මෙන්ම බිත්තර නිෂ්පාදනය අලෙවිය තුළින් අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික මට්ටම ඉහල නැංවීමට අපේක්ෂා කරනවා.

## 4.0 මිරිදිය ධීවර කටයුතු

4.1 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතට අයත් අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්කවල මහ පරිමාණ, මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ හා කාලීන ජලාශ තුන්දහසක් (3000) පමණ තිබෙනවා. මින් බොහොමයකම අභ්‍යන්තර මිරිදිය ධීවර වගාවයාර්ථකවයිදු කිරීමට

හැකියාව තිබෙනවා. ශ්‍රී ලංකාව තුළ 2014 වර්ෂයේ මිරිදිය මත්ස්‍ය වගාවේ අස්වැන්න මෙට්‍රික් ටොන් හැත්තැපන්දහස් හත්සිය පණහක් (මෙ.ටො. 75,750) පමණ වෙනවා. උතුරු මැද පළාත ජාතික නිෂ්පාදනයට එකතු කරන ප්‍රමාණය මෙට්‍රික් ටොන් විසිතුන්දහස් අටසිය හැටක් (මෙ.ටො.23,860) පමණ වෙනවා. ඒ අනුවසියයට තිස් එකක් (31%) පමණ ප්‍රමාණයක් ජාතික නිෂ්පාදනයට එකතු කරනවා.

4.2 ගරු සභාපතිතුමනි, පළාතේ ජලාශවලට අවශ්‍ය මත්ස්‍යඇඟිල්ලන් ජලජීවි අධිකාරියේ අභිජනන මධ්‍යස්ථාන වලින් පමණක් සැපයීමෙන් අවශ්‍යතා සම්පූර්ණ කර ගත නොහැකි බව පළාතේ ධීවර ජනතාව විසින් නිරන්තරවම පෙන්වා දෙන්වා. ප්‍රජා සහභාගිත්වයෙන් සුළු පරිමාණ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන (Mini Hachariese) ඇතිකළ යුතු බව ධීවර කාර්මිකයන්ගේ අදහසයි. මේ තුළින් ස්වයංරැකියා අවස්ථාද සැලසෙන අතර, පළාතේ මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය සියයට සියයකින් වැඩි කිරීමට හැකිවෙනවා. එබැවින් ධීවර සමිති මගින්මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ප්‍රවර්ධනයටත්, කුඩා තුළ මිරිදිය මත්ස්‍ය වගාවසංවර්ධනය සඳහාත් රුපියල් මිලියන දොළහක් (රු.මි.12) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

4.3 ඊට අමතරවසියයට හැටක(60%) සහනාධාර පදනම මත ධීවර ආම්පන්න ලබාදීමටත්, විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා උනන්දු කරවීමටත්, ධීවර කාර්මිකයන් පුහුණු කිරීම වැනි සියළු කාර්යයන් සඳහා රුපියල් මිලියන හයක (රු.මි.06) ප්‍රතිපාදන වෙන්කර දිමට මා යෝජනා කරනවා.

## 5.0 වාරිමාර්ග

5.1 වගා බිම් අක්කර එක් ලක්ෂ තිස්නව දහසකට (අක් 139,000) අධික ප්‍රමාණයක් පෝෂණය කරනු ලබන සුළු වාරිමාර්ග පද්ධති තුන්දහස් දෙසීයකින් (3,200) පමණ ශක්තිමත් වූ වාරි තාක්ෂණයකින් උතුරු මැද පළාත සමන්විත වෙනවා. එම වැව් පද්ධතිය තව දුරටත් සංවර්ධනය කරමින් හා ප්‍රශස්ථ මට්ටමින් නඩත්තු කර පවත්වාගෙන

යමින් පළාතේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථික මට්ටම ඉහළ නැංවීම අපගේ අභිප්‍රායයි.

5.2 දෙදහස් දහහතර (2014) වර්ෂය අවසානයේ මෙම පළාතට බලපෑ හදිසි ගංවතුර තත්ත්වය හේතුවෙන් පළාත් වාරි පද්ධතීන් දෙසීය අසූ පහකට (285) වැඩි සංඛ්‍යාවකට හානි සිදුවුණා. එයින් වැව් හැට හතක් (67) අධික ලෙස හානි සිදු වී තිබුණා. මේ හේතුවෙන් පළාතේ ගොවි ජනතාවගේ ජීවනෝපාය පිළිබඳ අවදානම් තත්ත්වයක් ඇති වුණා. ඒ පිළිබඳව මවිසින් අතිගරු ජනාධිපතිතුමාට කරුණු දක්වා සිටීමෙන් පසු හානියට පත් වාරි පද්ධති කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය රුපියල් මිලියන තුන්සිය විසිතුනක (රු.මි 323) අමතර ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් වෙන් කර ගැනීමට හැකිවුණා. එම ප්‍රතිපාදන උපයෝගි කරගෙන වාරි පද්ධතීන් හැත්තෑ හයක (76) ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළා. එම සියළු ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉහළ මට්ටක පවතින බව ඉතා සතුටින් ගරු සභාවට දන්වා සිටිනවා.

5.3 ගරු සභාපතිතුමනි, දෙදහස් දහසය (2016) වර්ෂයේදි සුළු වාරිමාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන එකසිය දහසයක (රු.මි.116) මුදලක්ද, කෘෂිමාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන විසි පහක (රු.මි.25) මුදලක්ද වෙන් කිරීමට මම යෝජනා කරනවා.එම ප්‍රතිපාදන උපයෝගිකරගෙන දෙදාස් දහසය(2016) වර්ෂයේදී වැව්, අමුණු හා ඇල පද්ධතීන් ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒවගේම වැව්, අමුණු සහ ඇල මාර්ග හා කෘෂිමාර්ගයන්ගේ සුළු නඩත්තු කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒසඳහා රුපියල් මිලියන අනූවක (රු.මි.90) ප්‍රතිපාදන වෙන් කරදෙනු ලබනවා.

5.4 ගරු සභාපතිතුමනි, අද වන විට වැව් තාවුළු ආශ්‍රිතව අනවසර ඉදි කිරීම් කටයුතු සිදු කිරීම නිසා වැව්වල ඉදිරි පැවැත්මට තර්ජන සිදුවී ඇති බවසියළු දෙනා දන්නා කරුණක්. ඉදිරියේ දි එවැනි වැව් වලට සිදුවන හානි අවම කර වැව් ආරක්ෂා කිරීම සඳහා මැනුම් කටයුතු සිදු කර වැව් තාවුළු ලකුණු කිරීම තුළින් වැව් ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවයටතේ ආරම්භ කිරීමට අපේක්ෂා කරනවා.ඒසඳහා වැය වන පිරිවැය සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය

සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන එකසිය දහසයක(රු.මි.116) ප්‍රතිපාදනය තුළින් ආවරණය කර ගැනීමට බලාපොරොත්තු වෙනවා.

## 6.0 ඉඩම් සංවර්ධනය

6.1 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතේ ඉඩම්වල භුක්තිය නිරවුල් වී නොතිබීම ගැටළුකාරී තත්ත්වයක් බවට පත්වී තිබෙනවා. මහජනයා මේ නිසා දැඩි අපහසුතාවයකට පත්වී තිබෙනවා. මෙය කාලාන්තරයක් තිස්සේ පවතින ප්‍රශ්ණයක් බැවින් ඊට ක්ෂණිකව විසඳුම් ලබාදීම පිණිස ඉඩම් කටයුතු වලට සම්බන්ධ මධ්‍යම රජයේ සහ පළාත් සභාවේ සියළුම නිළධාරීන් එකම ස්ථානයකට කැඳවා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජනතාව දැනුවත් කර ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීමටමා යෝජනා කරනවා. ඒසඳහා දෙදහස් දහසය(2016) වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කරනු ලබනවා.

6.2 ගරු සභාපතිතුමනි, දෙදහස් දහසය (2016) වර්ෂයේදී බලපත්‍ර පහළොස් දහසක් (15,000) නිකුත් කිරීමට බලාපොරොත්තුවන අතර, එය කඩිනම් කිරීම සඳහා නිලධාරීන්ට සුදුසු දිරි දීමනාවක් ගෙවීමට මා යෝජනා කරනවා. එම දිරිදීමනා ක්‍රමය යටතේ එක් බලපත්‍රයකට රුපියල් එකසිය පණහක උපරිමයක් විය යුතුයයි මා යෝජනා කරනවා. ඒ සඳහා රුපියල් මිලියන තුනක් (රු.මි.03) දෙදහස් දහසය (2016) වර්ෂයේදී වෙන් කර දෙනු ලබනවා.

6.3 ඊට අමතරවඉඩම් කාර්යයට සම්බන්ධ වන නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමටත් ඔවුන්ගේ සේවාවන් නිසි පරිදි ලබාදීමට හැකිවන පරිදි නව තාක්ෂණික උපකරණ මිළදී ගැනීමටත් රුපියල් මිලියනයක(රු.මි.01) ප්‍රතිපාදනයක් දෙදහස් දහසය (2016) වර්ෂය වෙනුවෙන් වෙන් කර දෙනු ලබනවා.

6.4 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතේ ඇති රජයේ ආයතන භුක්ති විඳින ඉඩම් මැණුම් කර එම ඉඩම් වල අයිතිය නිරවුල් කර එම ආයතනවලට ලබාදීම සඳහා නියමු ව්‍යාපෘතියක් වහාම ආරම්භ කරනවා.

6.5 රට අමතරවබෙදා දෙන ඉඩම්වල අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීමත් ඇතුළුව ඉඩම් සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන දෙකක (රු.මි.02) ප්‍රතිපාදනයක් වෙන් කර දෙනු ලබනවා.

## 7.0 පරිසර

7.1 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාත සුවිශේෂිවූ පාරිසරික ලක්ෂණයන්ගෙන් යුත් පළාතක් වන අතර, එම පරිසරය මනාවසංරක්ෂණය කර අනාගත පරපුර වෙනුවෙන් දායාද කිරීම අපේ වගකීමක් වෙනවා.

7.2 එම වගකීම ඉටු කිරීම සඳහා පාසැල් දරුවන් ඇතුළු ප්‍රජාව දැනුවත් කිරීම අවශ්‍ය වනවා. පාසැල් මට්ටමින් පරිසර බට කණ්ඩායම් පිහිටුවීම සඳහා රුපියල් මිලියන තුනක (රු.මි.03) ප්‍රතිපාදනයක් වෙන් කරදීමට කටයුතු කරනවා.

7.3 ස්වභාවික උයන් සහ ජල උල්පත් අපට ස්වභාවධර්මයෙන් උරුමකරදුන් දායාදයන්ය. එම ජලඋල්පත් සංරක්ෂණය කර ගැනීම සඳහා රුපියල් මිලියන හතරක (රු.මි.04) ප්‍රතිපාදන වෙන් කරනු ලබනවා.

7.4 උතුරු මැද පළාතට දේශිය සහ විදේශීය සංචාරකයින්ගේ පැමිණීම වැඩිවෙමින් පවතිනවා. ඒ නිසා පළාතේ නගර ඉතා අලංකාර ලෙය පැවතිය යුතුව තිබෙනවා. එබැවින් නගර අලංකාර කිරීමේ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන දහයක (රු.මි.10) ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරනු ලබනවා.

## 8.0 කර්මාන්ත

8.1 ගරු සභාපතිතුමනි, 2014 මහ බැංකු වාර්ථාවේ සඳහන් දත්ත අනුව දළ දේශිය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයේ පළාතේ දායකත්වය සියයට හතරයි දශම එකක (4.1%) අඩු අගයක්ව පවතිනවා. එමෙන්ම දළ දේශිය නිෂ්පාදිතයේ දායකත්වය අනුවපළාත් අතර අපට හිමිවී ඇත්තේ හත්වන (7) ස්ථානයයි.

8.2 මෙම ස්ථානයෙන් ඉහළට ඒමසඳහාපළාත් කර්මාන්ත සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට රුපියල් මිලියන එකක (රු.මි.01) ප්‍රතිපාදනයක් වෙන් කිරීමට යෝජනා කරනවා.

8.3 උතුරු මැද පළාත තුළ විසිර සිටින සුළු හා මධ්‍යම පරිමාණ විවිධ කර්මාන්ත කරුවන් දිරිගන්වා නිෂ්පාදනයවැඩි කිරීම තුළින් කර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය වැඩිකරලීමේ අරමුණ ඇතිවසංචාරක කර්මාන්තය, වඩු කර්මාන්තය, රේෂ කර්මාන්තය, හස්ත කර්මාන්තය හා විවිධ සුළු පරිමාණ නිෂ්පාදන ක්ෂේත්‍රයන් තුළින් ජාතික නිෂ්පාදනයට කරන දායකත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන සලසා දී තිබෙනවා.

8.4 **සංචාරක කර්මාන්තය**

ගරු සභාපතිතුමනි, සංචාරක මණ්ඩලයේ මූලාශ්‍ර වලට අනුව දෙදහස් පහළොවවර්ෂයේ ජනවාරි සිට මේ දක්වා සංචාරකයක් එක්ලක්ෂ අනූ හතර දහස් හයසිය හතක් (194,607) මේ පළාතට පැමිණ තිබෙනවා. ඉදිරියේදී මීට වඩා සංචාරකයන් පිරිසක් ගෙන්වා ගැනීමට අපේක්ෂා කරනවා. ඒවෙනුවෙන් අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

8.5 අනුරාධපුර පොළොන්නරුව දිස්ත්‍රික් දෙකටම කේන්ද්‍ර වන පරිදි හබරණ නගරය සංචාරක නගරයක් බවට පත් කිරීමට අවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන පණහක් (රු.මි.50) වෙන් කිරීමට මා යෝජනා කරනවා.ඊට අමතරවඅනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහි සංචාරක ආකර්ශණීයස්ථාන දහයක් (10) ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

8.6 විදේශීය සංචාරකයින්ට උචිත වන අයුරින් නිදහස් - සුවපහසු ඒකාබද්ධ විවේක මධ්‍යස්ථාන නවීකරණය කිරීම සංචාරකයින් පළාතේ රඳවා ගැනීමට අත්‍යවශ්‍ය වනවා. එම වැඩසටහන සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

8.7 ඒවගේම ගෘහස්ථ සංචාරක කර්මාන්තය (Home-stay)වැඩිදියුණු කිරම සඳහා රුපියල් මිලියන පහක්ද (රු.මි.05) සංචාරක කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකින් පුහුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන පහක්ද (රු.මි.05) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

8.8 **වඩු කර්මාන්තය හා රේෂ කර්මාන්තය**

8.8.1 ගරු සභාපතිතුමනි, අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික් වල වඩු කර්මාන්තය නගා සිටුවීම පිණිසයියළු පහසුකම් වලින් සමන්විත පුහුණු මධ්‍යස්ථාන දෙකක් (2) සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන විස්සක් (රු.මි.20) වැය කර ආරම්භ කිරීමටද බලාපොරොත්තු වෙනවා.

8.8.2 තනි තනිව නිෂ්පාදන කටයුතු විසිර සිදුකරනවා වෙනුවට නිෂ්පාදන ගම්මාන සංකල්පය අනුව යමින් පළාත තුළ රේෂකර්ම ගම්මාන පහක් (05) ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන පහක් (රු.මි.05) වැය කිරීමට බලාපොරොත්තු වෙනවා.

8.8.3 දේශීය සාම්ප්‍රදායක හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා නව තාක්ෂණය උපයෝගී කරගෙන නිෂ්පාදනවල අගය වැඩි කරමින් වත්මන් වෙළඳපල ප්‍රවණතාවලට සුදුසු මට්ටමේ නිෂ්පාදකයන් දිරි ගැන්වීමටද රුපියල් මිලියන පහක් (රු.මි.05) මුදලක් වෙන් කිරීමටද කටයුතු කරනවා.

8.8.4 සුළු හා මධ්‍ය කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සමතුලිත ප්‍රාදේශිය සංවර්ධනයක් ඇති කිරීමට හා සමාජයීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා පළාතේ කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළඳපල අවස්ථා තව දුරටත් පුළුල් කළ යුතු වෙනවා. දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂනය දිනාගත් ස්ථාන කිහිපයකට ලඟා විය හැකි කේන්ද්‍රගත නගරය වී ඇති හබරණ කර්මාන්ත නිෂ්පාදන අලෙවි සංකිර්ණයක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු යොදනවා. මේ සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කර තියෙනවා.

8.8.5 "එක් ගමකට එක් කර්මාන්තයක්" යන සංකල්පය යටතේ කර්මාන්ත ගම්මාන පිහිටුවා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් දිරිගැන්වීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීම සඳහා චක්‍රීය අරමුදලක් පිහිටුවා සියයට දෙකක(2%) පමණ සේවා ගාස්තුවක් අයකරමින් වසර තුනකින් ගෙවා නිම කිරීමේ පදනම මත ණය මුදලක් ලබාදීමසුදුසුයැයි මා යෝජනා කරනවා. ඒ සඳහා රුපියල් මිලියන දහයක (රු.මි.10) ප්‍රතිපාදනපළාත් භාණ්ඩාගාරයේ අයවැය සහය සේවා ව්‍යාපෘතිය යටතේ දෙදහස් දහසය(2016) වර්ෂයේදී ලබාදීමට කටයුතු කරනවා.

8.8.6 වඩු,පේෂකර්ම,හස්ත කර්මාන්ත ක්ෂේත්‍රවල කර්මාන්ත කරුවන් හා ශිල්පීන් සඳහා නවීන තාක්ෂණය භාවිතා කර නවනිෂ්පාදන ප්‍රවණතාවයන්ටයොමු කිරීම සඳහා මෙවර අයවැයෙන් රුපියල් මිලියන දෙකයි දශම පහක (රු.මි.2.5) ප්‍රතිපාදනයක් වෙන් කිරීමට කටයුතු කරනවා.

8.8.7 බොහෝ පේෂකර්ම මධ්‍යස්ථාන දිගුකාලයක සිට අළුත්වැඩියා කර නැහැ. ඒ නිසා පේෂකර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන පහක් (රු.මි.05) වෙන්කරනවා.

8.8.8 අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා එහි නියැලී සිටින කාර්මිකාවන් දිරිගැන්වීමක් වශයෙන් දැනට ගෙවනු ලබන පැමිණීමේ දීමනාවසියයට සියයකින් (100%) වැඩිකර මසකට රුපියල් දෙදහක (රු.2000/-) දීමනාවක් ගෙවීමට මා යෝජනා කරනවා.

8.8.9 අපේ පළාතේ ඇති වාර්ෂික උත්සව අතුරින් ප්‍රධාන තැනක් ගනු ලබන්නේ වාර්ෂිකව පවත්වනු ලබන කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශණයයි. මෙවර එය උත්කර්ෂවත් අයුරින් පැවැති අතර මීටත් වඩා අතිඋත්කර්ෂවත් අන්දමින් දෙදහස් දහසය (2016) වර්ෂයේදී පවත්වා නිෂ්පාදකයින් සඳහා වෙළඳපල විවර කරදීමට

අවශ්‍ය කටයුතු සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කර දීමට යෝජනා කරනවා.

## 9.0 සමුපකාර

9.1 ගරු සභාපතිතුමනි, සමුපකාර ක්ෂේත්‍රය සඳහා පෙර වර්ෂවල වෙන්වූයේ ඉතාම අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක්. නමුත් මා මෙවර අයවැයෙන් සමුපකාර ක්ෂේත්‍රයට රුපියල් මිලියන තිස්පහක (රු.මි.35) ප්‍රතිපාදනයක් වෙන් කර දීමට කටයුතු කර තිබෙනවා.

9.2 සමුපකාර සේවකයින්ගේ පුහුණුවීම් කටයුතු සඳහා මල්වානේගම මානවසම්පත් කේන්ද්‍රය අංග සම්පූර්ණ පුහුණු මධ්‍යස්ථානයක් ලෙසවැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන පහළොවක් (රු.මි.15) වෙන් කිරීමටත්, පොළොන්නරුව දිස්ත්‍රික් සමුපකාරසහකාර කොමසාරිස් කාර්යාලය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කිරීමටත් මා යෝජනා කරනවා.

9.3 එමෙන්ම පළාතේ සමුපකාර සමිති ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන පහක්ද (රු.මි.05) ග්‍රාමීය සමුපකාර සමිති වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන දෙකයි දශම හයක් ද, (රු.මි.2.6) ආයතනික හා ධාරිතා සංවර්ධනය සඳහා රුපියල් මිලියන හතරයි දශම හතරක් ද (රු.මි.4.4) වෙන් කර තිබෙනවා.

9.4 සමුපකාර ක්ෂේත්‍රය පවත්වාගෙන යාම සඳහා එහි රැඳෙමින් සමුපකාර සේවකයින් අහනා මෙහෙවරක් ඉටුකරනවා. එම සේවකයින්ගේ මෙහෙවර අවසන් වූ පසු විශ්‍රාමික කාලය ආර්ථික වශයෙන් ශක්තිමත්ව ගත කිරීම සඳහා ඇතිකර ඇති විශ්‍රාම වැටුප් අරමුදලට රුපියල් මිලියන තුනක (රු.මි.03) ප්‍රදානයක් ලබාදිය යුතුයැයි මා යෝජනා කරනවා.

## 10.0 ආර්ථික යටිතල පහසුකම්

### 10.1 පළාත් මාර්ග

10.1.1 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාත් සභාව යටතටයි ශ්‍රේණියේ සහ බී ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් එක්දහස් නවසිය හතළිස් හතක් (කි.මී.1947) පැවරී තිබෙනවා. මෙම මාර්ග වලින් සී ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් එක්දහස් දෙසිය එකොළහක්ද (1211) ඩී ශ්‍රේණියේ මාර්ග හත්සිය තිස්හයක්ද (736) වෙනවා.

මෙම මාර්ග වලින් බොහොමයක් විශාල වශයෙන් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතිනවා. නමුත් මෙම මාර්ග සියල්ලම එකවර අළුත්වැඩියා කිරීමට තරම් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව යොදවා ගැනීමේ අවශ්‍යතාවය මතුවී තිබෙනවා. මැකඩම් ක්‍රමය මගින් මාර්ග වැඩිදියුණු කිරීමේදී අඩු වියදමකින් වැඩි කිලෝමීටර් ප්‍රමාණයක ප්‍රතිසංස්කරණයන් කළ හැකි බව පෙනී යනවා. රථවාහන ගමනාගමනය අඩුග්‍රාමීය මාර්ග සඳහා මෙම ක්‍රමය වඩාත් යෝග්‍ය වනවා. එබැවින් ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය ඩී ශ්‍රේණියේ මාර්ග තෝරාගෙන මැකඩම් ක්‍රමය මගින් අළුත්වැඩියා කිරීම සඳහා දෙදහස් දහසය වර්ෂයට රුපියල් මිලියන එකසිය හැටක් (රු.මි.160) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

10.1.2 ඒවගේම ප්‍රතිසංස්කරණයන් අත්‍යවශ්‍ය සී ශ්‍රේණියේ මාර්ග තෝරාගෙන එම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන දෙසීයක (රු.මි.200) ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

10.1.3 පළාතේ මාර්ගවල පැවැත්ම සඳහා කාලීනව නඩත්තු කිරීම් අවශ්‍ය වනවා. ඒවගේම එම නඩත්තුවසැලසුම් සහගත ලෙස ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වනවා. නිරන්තරව මාර්ග නඩත්තු කිරීම සඳහා එක් කොට්ඨාශයකට රුපියල් මිලියන විස්ස(රු.මි.20) බැගින් කොට්ඨාශ හය(06) සඳහා රුපියල් මිලියන එකසිය විස්සක් (රු.මි.120) වෙන් කිරීමට මායෝජනා කරනවා.

10.1.4 ඒවගේම එම මාර්ග නඩත්තු කටයුතු අඩු පිරිවැයකින් ඉටු කර ගැනීම සඳහා සෑම විධායක ඉංජිනේරු කාර්යාලයකම ඇති නඩත්තු ඒකක ශක්තිමත් කිරීමට මා බලාපොරොත්තුවෙනවා. ඒසඳහා අවශ්‍ය වන ගල්රෝල්, මෝටර් ගේඩර්, ජේ.සී.බී.,වතුර බවුසර් සහ ජම්පින් වැකර් යන උපකරණ මිළදී ගැනීම සඳහා

රුපියල් මිලියන අසූවක (රු.මි.80) ප්‍රතිපාදන වෙන් කරදීමට මා බලාපොරොත්තු වෙනවා.

10.1.5 වීථිමත් මාර්ග පද්ධතියක ඇතුළත් විය යුතු මාර්ග සංඥා පුවරු, මාර්ග තොරතුරු ඇතුළත් නාම පුවරු, මාර්ග දෙපසසීමා ලකුණු සඳහන් වීම අවශ්‍ය වුවත් පළාත් මාර්ග පද්ධතිය තුළ මෙතෙක් එම අවශ්‍යතා සම්පූර්ණ වී නැහැ. එය රිය අනතුරු වැඩිවීමට එක් හේතුවක් වී තිබෙනවා. දෙදහස් දහසය (2016) වර්ෂයේදී නියමු ව්‍යාපෘතියක් ලෙසපෙර සඳහන් අඩුපාඩු සකස් කිරීම සඳහා රුපියල් මිලියන තිස් හතයි දශම පහක් (රු.මි.37.5) වෙන් කර දෙනු ලබනවා.

10.1.6 උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය දෙදහස් දහතුන වර්ෂයේ ආරම්භ කර දෙදහස් දහඅට වර්ෂයේදී නිම කළ යුතු ව්‍යාපෘතියකි. එම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් මාර්ග සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන හාරසිය හැත්තෑවයි දශම අටක ප්‍රතිපාදන මෙම අයවැයෙන් වෙන් කර දෙනු ලබනවා.

## 10.2 ප්‍රවාහන

10.2.1 ප්‍රවාහන ක්ෂේත්‍රයේ පෞද්ගලික බස්රථ නියාමනය මෙම පළාත් සභාවට පැවරී තිබෙනවා. උතුරු මැද පළාතේ සංවර්ධනයට සක්‍රිය දායකත්වයක් පොදු ප්‍රවාහන සේවයෙන් ලබා දෙනවා. මගී ජනතාවට ගුණාත්මක ප්‍රවාහන සේවයක් ලබාදීම සඳහා මානවසම්පත් කළමනාකරණය කරමින් ප්‍රවාහන සේවාවේ නියාමනයන් සිදු කිරීම අවශ්‍ය වෙනවා.

10.2.2 කලට වේලාවට බස් රථ ධාවනය වීමත්, සේවාවසපයන කාර්ය මණ්ඩලයේ විනය ගරුක භාවයත් මගී ජනතාව බලාපොරොත්තු වෙනවා. නමුත් මගී ප්‍රවාහන සේවාවේ අඩුපාඩුකම් පිළිබඳ නිරන්තරවපැමිණිලි ලැබෙමින් පවතිනවා. එම පැමිණිලි අනුවපෙනී යන්නේ නියමිත වේලාවට බස් රථ ධාවනය නොවීම හා ප්‍රවාහන සේවාවේ නියැලෙන ඇතැම්ව්‍යවසායකයන් ඇතුළු

කාර්ය මණ්ඩලවල විනය ගරුක භාවය අඩුකම පිළිබඳවයි. එබැවින් ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යවසායකයන් ඇතුළු කාර්ය මණ්ඩලයසඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඔවුන්ට පුහුණුව ලබාදීමටත්, කලට වේලාවට බස් රථ ධාවනය කිරීම සඳහා වේලා සටහන් කරන නවීන තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීමටත් බලාපොරොත්තු වෙනවා. ඒසඳහා රුපියල් මිලියන හතරක් (රු.මි.04) මෙවර අයවැයෙන් වෙන් කර දීමට මා යෝජනා කරනවා.

10.2.3 ප්‍රවාහන අධිකාරිය ආරම්භකර දැනට වසර පහළවක් (15) ක් ගතවී ඇති නමුත් එහි සේවය කරනු ලබන කාර්යය මණ්ඩලය සඳහා ස්ථිර කාර්යාල පහසුකම් නොමැති වීම ගුණාත්මක සේවාවක් ජනතාවට ලබාදීමට බාධාවක් වී තිබෙනවා. එම අඩුපාඩුවසම්පූර්ණ කිරීමක් වශයෙන් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන දොළහක ප්‍රතිපාදන (රු.මි.12) වෙන් කරනු ලබනවා.

## 10.3 ග්‍රාම සංවර්ධන

10.3.1 ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිති එක්දහස් එකසිය විසි හතරක් (1,124) යටතේ සංවිධානය වී ඇති ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය උතුරු මැද පළාතේ ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබනවා. රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශවල අවධානය ලක් නොවූ එහෙත් මහජනයා විසින් ප්‍රයෝජනයට ගනු ලබන ග්‍රාමීය ප්‍රවේශ මාර්ග, බෝක්කු වැනි යටිතල පහසුකම් ග්‍රාමීය ප්‍රජා දායකත්වයක් ඇතිවසංවර්ධනය කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකයට විශාල සේවයක් කරනවා. එම සේවාව එසේම පවත්වාගෙන යාම සඳහා දෙදහස් දහසය වර්ෂයේදී (2016) රුපියල් මිලියන තුනක (රු.මි.03) ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා.

10.3.2 ග්‍රාමීය පවුල් නඟා සිටුවීමටත් ඔවුන් තුළ අභිමානයක් ඇතිකොට සාමාජ්‍ය හර පද්ධති නොනැසී පවත්වාගෙනයාම අරමුණු

කරගත් "දැහැමි නිවහන"වැඩසටහන තවදුරටත් පවත්වාගෙන යාම සඳහා රුපියල් මිලියන දෙකක(රු.මි.02) ප්‍රතිපාදනයක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

10.3.3 සාමාජ්‍ය හා ආර්ථිකවශයෙන් පහල මට්ටමක ජීවත්වන අනාරක්ෂිත නිවාසවල පදිංචි ජනතාවට උපකාර කිරීමට "ශ්‍රමාභිමානී" නිවාසවැඩසටහන සඳහාත්, කාන්තාවන් සවිබල ගැන්වීමේ "ලියසවිය"වැඩසටහන සඳහාත්, සංස්කෘතිකාංග සුරැකීම අරමුණුකරගත් "ගම්දොර අභියස" යන සියළු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත්රුපියල් මිලියන අටක (රු.මි.08) ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා.

## 10.4 නිවාස

10.4.1 ජීවත්වීම සඳහා සෑම පවුලකටම නිවසක් තිබීම මානුෂික අයිතිවාසිකමකි. එම අයිතිවාසිකම සපුරනුවස් අඩු ආදායම්ලාභී පවුල්වලට මධ්‍යම රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන නිවාසව්‍යාපෘති වලට අමතරවනිවාස අළුත්වැඩියා කරදීමට සහ පිළිසකර කර ගැනීමටඅවශ්‍ය මූල්‍ය සහ ද්‍රව්‍යමය සහනයන් ලබාදීම සඳහා රුපියල් මිලියන නවයක (රු.මි.09) ප්‍රතිපාදනයක් වෙන් කරනු ලබනවා.

## 10.5 ප්‍රාදේශිය සංවර්ධනය

10.5.1 ප්‍රාදේශීය සංවර්ධනයේදී පළාත් සභා මහජනනියෝජිතයින් වශයෙන් මන්ත්‍රීතුමන්ලා වෙත විවිධ සංවර්ධන යෝජනා ඉදිරිපත් වෙනවා. එම සංවර්ධන යෝජනා ප්‍රදේශයට උචිත පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් විමධ්‍යගත අයවැය යටතේ මෙතෙක් ලබාදුන් රුපියල් මිලියන දෙකයි දශම පහක් (රු.මි.2.5) වූ ප්‍රතිපාදනය රුපියල්

මිලියන පහක් (රු.මි.05) දක්වා සියයට සියයකින් (100%) වැඩි කළ යුතු යැයිමා යෝජනා කරන්නේ ඉතාමත් සතුටින්.

## 10.6 ග්‍රාමීය යටිතල පහසුකම්

10.6.1 ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහාත්, ග්‍රාමීය ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහාත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අවශ්‍ය වෙනවා. මහජන නියෝජිතයන් වෙත ලැබෙන ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් ග්‍රාමීය ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය, ජලපහසුකම් ලබාදීම, සනීපාරක්ෂක පහසුකම් ලබාදීම වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන හැටක (රු.මි.60) ප්‍රතිපාදන වෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

## 10.7 පළාත් පාලන සේවා

10.7.1 උතුරු මැද පළාත තුළ ස්ථාපිත ප්‍රාදේශීය සභා විසි පහක් සහ එක් මහ නගර සභාවක් මගින් ජනතාවසඳහා අවශ්‍යවන උපයෝගිතා සේවා සැපයීම කරනු ලබනවා. ඒ අතර පළාත් පාලන මාර්ග, ප්‍රජා ජල සැපයුම්, කසල කළමනාකරණය ප්‍රධාන ස්ථානයක් ගන්නවා. මෙම සේවාවන් ගුණාත්මක මට්ටමින් ජනතාවට සැපයීම සඳහා මතු දැක්වෙන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන දෙදාස් දහසය වර්ෂයේදී වෙන් කිරීමට මා යෝජනා කරනවා.

10.7.1.1 ග්‍රාම සේවා වසම් හතළිහට වැඩි පළාත් පාලන ආයතන සඳහා රුපියල් මිලියන පහ (රු.මි.05) බැගින්ද ග්‍රාම සේවා වසම් හතළිහට(40) අඩු පළාත් පාලන ආයතනසඳහා එක් ප්‍රාදේශීය සභාවකට රුපියල් මිලියන තුන (රු.මි.03) බැගින් පළාත් පාලන මාර්ග සෘජු ශ්‍රම පදනම මත ප්‍රතිසංසකරණය කිරීම සඳහා රුපියල් මිලියන අනූ හතරක් (රු.මි.94) වෙන් කරනු ලබනවා.

10.7.1.2 මේ වන විටත් නිම කර නොමැති කැබිතිගොල්ලෑව-යකාවැව, කැකිරාව-සූරියගම, පදවිය-සීයාය පානීය ජල ව්‍යාපෘති සම්පූර්ණයෙන් නිම කිරීම සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල අත්‍යවශ්‍ය පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මිලියන දහයක් (රු.මි.10) වෙන් කරනු ලබනවා. මීට අමතරව ආසියානු සංවර්ධන බැංකු වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සියළුම පළාත් පාලන ආයතන හරහා පළාතේ පානීය ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට කටයුතු කරනවා.

10.7.1.3 දිඹුලාගල, වැලිකන්ද ප්‍රාදේශීය සභා දෙකෙහි අළුතින් ගොඩනැගිලි ඉදිකිරීමටත් අනෙකුත් ප්‍රාදේශීය සභාවන්හි අඩක් නිමකළ කාර්යාල පරිශ්‍ර නිම කිරීම සඳහාත් රුපියල් මිලියන තිහක(රු.මි.30) ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා.

10.7.1.4 ඊට අමතරව ප්‍රජා මණ්ඩල බලගැන්වීම සඳහා රුපියල් මිලියන පහක්ද, පුස්තකාල සංවර්ධනය, සුසානභූමි සංවර්ධනය ඇතුළු පළාත් පාලන ආයතනවල උපයෝගිතා සේවා වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන තිහක්ද (රු.මි.30) ලබාදීමට මා යෝජනා කරනවා.

10.7.1.5 අනුරාධපුර හා පොළොන්නරුව නගරය තුළ ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති මලඅපවහන පද්ධතීන් දෙකෙහි වැඩ නිම කිරීම සඳහා රුපියල් මිලියන පණහක් (රු.මි. 50) වෙන්කරනු ලබනවා.

10.7.1.6 ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ජල, ක්‍රීඩාපිටි, සතිපොළ, නිවාඩු නිකේතන, මාර්ග, වෙළඳ සංකීර්ණ හා පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධනයවැනි විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන එක්දහස් හයසියයක් (රු.මි.1,600) වෙන්කර දෙනු ලබනවා.

## 10.8 විකල්ප බලශක්ති

10.8.1 ජාතික විදුලි බල පද්ධතිය මගින් විදුලි පහසුකම් සැපයිය නොහැකි එහෙත් වීදි ලාම්පු අවශ්‍යතාවය පවතින මංසන්ධි සඳහා සූර්ය බලයෙන් ක්‍රියාකරන වීදි ලාම්පු සවි කිරීම සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) දෙදහස් දහසය (2016) වර්ෂය සඳහා වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

## 10.9 විශේෂ ව්‍යාපෘති

### 10.9.1 ආයෝජන ප්‍රවර්ධනය හා ජීවනෝපාය සංවර්ධනය

උතුරු මැද පළාතේ ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා විදේශ ආයෝජන මෙම පළාතට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මා බලාපොරොත්තු වනවා. ඊට අමතරව රැකියා විරහිත තරුණ තරුණියන් විදේශ රැකියා වලට යොමු කිරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමට පුහුණු හා අධ්‍යාපන පහසුකම් සලසා දීමට කටයුතු කරනවා. ඒ යටතේ දැනට ක්‍රියාත්මක කොරියානු භාෂා පුහුණු පාඨමාලාව හා ජීවිතාරක්ෂක පුහුණු පාඨමාලාවට අමතරව දෙදහස් දහසය වර්ෂයේදී ජපන් භාෂා පුහුණු පාඨමාලාව ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. දිරිය සහන වැඩසටහන යටතේ ස්වයංරැකියාලාභීන් සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් දිරිමත් කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය උපකරණ හා පහසුකම් සලසා ගැනීම සඳහා සියයට හැටක (60%) දායකත්වයක් ලබාදීමට කටයුතු කරනවා. මෙම සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන හැත්තෑපහක (රු.මි.75) ප්‍රතිපාදන වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

10.9.2 වන අලි තර්ජිත ගම්මානවල ආරක්ෂාවසඳහා විකර්ෂක ශාඛ වැවීම, මීමැසි ජනපද වැටවල් ආකාරයට සකස් කිරීම වැනි ජෛව විද්‍යාත්මක ක්‍රම මගින් අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස රුපියල් මිලියන දහයක (රු.මි.10) ප්‍රතිපාදනයක් වෙන් කර දෙනු ලබනවා.

10.9.3 තොරතුරු තාක්ෂණ ගම්මාන ව්‍යාපෘතිය

තොරතුරු තාක්ෂණය හඳුන්වාදී වසර ගණනාවක් ගතවුවත් රට සමගාමීව පළාතේ තොරතුරු තාක්ෂණය වර්ධනය වී නැහැ. ගමට තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ ගලාගොස් නැති නිසා කෘෂිකර්ම හා කර්මාන්ත ක්ෂේත්‍රවල වර්ධනය ඉතා හෙමින් සිදුවන බව පෙනී යනවා. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත උත්පාදනය වීමේ ඉඩප්‍රස්ථා අඩු බවක් පෙනී යනවා. එබැවින් නියමු ව්‍යාපෘතියක් විදියට රජරට විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ ඒකකය හා ඒකාබද්ධව තොරතුරු තාක්ෂණ ගම්මාන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඒසඳහා රුපියල් මිලියන විසිපහක (රු.මි.25) ප්‍රතිපාදන වෙන් කර දීමටකටයුතු කරනවා.

## 11.0 අධ්‍යාපන

11.1 ගරු සභාපතිතුමනි, අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි නිපුණතාවලින් පිරිපුන් දරු පිරිසක් සමාජයට දායාද කිරීම අධ්‍යාපනයේ අරමුණයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මුල් ළමාවියේ සිට උසස් අධ්‍යාපනයේ දොරටුව දක්වා දරුවන්ගේ අධ්‍යාපන නිපුණතා සංවර්ධනය කිරීම පළාත් සභාවේ වගකීම බවට පත්වී තිබෙනවා. මෙම වගකීම ඉටු කිරීමේදී විවිධ නම් වලින් පාසල් සංවර්ධනය කිරීම වෙනුවට පොදුවේ සිසු පෞරුෂය වර්ධනය වන පරිදි පළාතේ අධ්‍යාපනසංවර්ධන අවශ්‍යතා තේරුම්ගෙන ඒ පිළිබඳව කරනු ලබන අධ්‍යයනයකින් පසුව පාසල් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වෙනවා.ඒ අනුව තුන් අවුරුදු සැලැස්මක් යටතේ භෞතික සම්පත් මෙන්ම මානවසම්පත් සංවර්ධනය කරමින් පොදු අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට මා අදහස් කරනු ලබනවා. දෙදහස් දහසය (2016) මුදල් වර්ෂය වෙනුවෙන් මා විසින් අද දින ඉදිරිපත් කරන මේ අයවැය තුළින් සියයට හතළිස් අටයි දශම නවයක (48.9%) ප්‍රතිපාදන අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වෙන්කර දීමට මා කටයුතු කර තිබෙනවා.

11.2 ගරු සභාපතිතුමනි,දරුවකුගේඅධ්‍යාපන නිපුනතා සංවර්ධනය ආරම්භ විය යුත්තේ මුල් ළමාවියෙනි. උතුරු මැද පළාතේ ලියාපදිංචි පෙර පාසල්

එක්දහස් තුන්සිය අසූතුනක් (1383) තුළ දරුවන් තිස්පන්දාහක් (35000) පමණ මුල් ළමාවිය අධ්‍යාපන කටයුතුවල නිරතවී සිටිනවා.එම මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථානවලට අවශ්‍ය පහසුකම් නොතිබීම මහත් ගැටළුවකි. ඒ නිසාපෙර පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන විසිපහක් (රු.මි.25) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

11.3 රට අමතරටයසියළු නවීන පහසුකම් සහිත පෙර පාසල් දෙකක් අනුරාධපුර හා පොළොන්නරුවනගර කේන්ද්‍රකර ගනිමින් නියාමන ව්‍යාපෘතියක් විදියට සංවර්ධනය කිරීමට මා බලාපොරොත්තු වෙනවා. එම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන තිහක (රු.මි.30) ප්‍රතිපාදනයක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

11.4 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාත තුළ පෙර පාසල් පාලිකාවන් දෙදහස් හාරසිය දාහතක් (2417) සේවය කරනවා. ඔවුන් දරුවන්ගේ අනාගතය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළත්සුදුසු අභිප්‍රේරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙන්නේ නැ. ඒ නිසා දෙදහස් දහසය (2016) මෙවර අයවැයෙන්පාලිකාවන් දෙදහකට (2000) දැනට ගෙවනු ලබන රුපියල් දාහක (රු1000/-) මාසික දීමනාවසියයට සියයකින්(100%) වැඩිකර රුපියල් දෙදාහ (රු.2000/-) බැගින් පාලිකාවන් දෙදහස් හාරසිය දාහත්(2417) දෙනාටම ගෙවීමට මා යෝජනා කරනවා.

11.5 රට අමතරටපෙර පාසල් පාලිකාවන්සඳහා ජීවිත රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීමටත්, විශ්‍රාම වැටුප් අරමුදලක් ඇති කිරීමටත් රුපියල් මිලියන පහක් (රු.මි.05) මූලික අදියර වශයෙන්දෙදහස් දහසය (2016) වර්ෂයේදී වෙන් කිරීමට මා යෝජනා කරනවා.

11.6 පෙර පාසල් පාලිකාවන්ගේ කුසලතා සංවර්ධනය සඳහා සංවිධානය කර ඇති ඩිප්ලෝමා පාඨමාලාවසඳහා දැනට අයකරනු ලබන ගාස්තුවෙන් නිදහස් කොට පළාත් සභාවේ කළමණාකරන සංවර්ධන හා පුහුණු ඒකකය මඟින් ලියාපදිංචි ගාස්තුව පමණක් අයකර නොමිලේ ඩිප්ලෝමාව ලබාදීම සඳහාත්,ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහාත්රුපියල් මිලියන හතක් (රු.මි.07) වෙන් කරනු ලබනවා.

11.7 කුඩා දරුවන් නිවාස පරිසරය තුළ සතුටින් සහ ආරක්ෂිතව තබා ගැනීම පිළිබඳවදෙමාපියන් දැනුවත් කිරීම මුල් ළමාවිය සංවර්ධනයේදී අනිවාර්යයෙන්ම කළයුතු වෙනවා. එබැවින් දෙමාපියන් දැනුවත් කිරීම සඳහා වන වැඩසටහන් පැවැත්වීම සඳහා රුපියල් මිලියන දෙකයි දශම හතරක (රු.මි.2.4) ප්‍රතිපාදන වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

11,8 මේ අනුව මුල් ළමාවිය සංවර්ධනය සඳහා සමස්ථයක් වශයෙන් රුපියල් මිලියන එකසිය තිස් දෙකක (රු.මි.132) ප්‍රතිපාදන මෙවර අයවැයෙන් වෙන්කර තිබෙනවා. මෙම ප්‍රතිපාදන ප්‍රමාණය පළාත් සභා ඉතිහාසයේ මුල් ළමාවිය සංවර්ධනය සඳහා වෙන් කරන ලද වැඩිම ප්‍රතිපාදන ප්‍රමාණය බව මා සතුටින් ප්‍රකාශ කරනවා.

## 11.9 ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන සංවර්ධනය

11.9.1 උතුරු මැද පළාතේ දැනට සිසුන් දෙලක්ෂ හැත්තෑපන්දහස් තුන්සිය හතළිස් තුනක් (275,343) පමණ අධ්‍යාපනය ලබනවා. පාසල් දහසේ ජාතික ප්‍රතිපත්තියට අනුව ද්විතීයික පාසල් වලින් ප්‍රාථමික අංශය ඉවත් කිරීම නිසා ප්‍රාථමික පන්ති සඳහා ගොඩනැගිලි අවශ්‍යතාවය දැඩිව මතුවී තිබෙනවා. ඒවගේම ජනප්‍රිය නාගරික පාසල් සඳහා වන ඉල්ලුමවැඩිවෙමින් පවතිනවා. එමෙන්ම ප්‍රාථමික අධ්‍යාපනයට අවශ්‍ය අනෙකුත් භෞතික පහසුකම්වල හිඟයක් පවතිනවා. එබැවින් තෝරාගත් ප්‍රාථමික පාසල්වල ගොඩනැගිලි සහ උපකරණ අවශ්‍යතාසම්පූර්ණ කර ජනප්‍රිය පාසල්වල පවත්නා සම්පත් ප්‍රමාණයම සපයා දී එවැනි නාගරික පාසල් වලට ඇති තරඟය අඩු කිරීම සඳහා රුපියල් මිලියන අනූපහක (රු.මි.95) ප්‍රතිපාදන වෙන් කර දීමට මා කටයුතු කරනවා.

11.9.2 උතුරු මැද පළාතේ ද්විතියික අධ්‍යාපන අවශ්‍යතාවල විශාල අඩුවක් පවතිනවා. විශේෂයෙන්ම විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා විදේශ භාෂා වැනි විෂයයන් හැදෑරීමේ පහසුකම් ඉතා අඩුවෙන් පවතිනවා. එම නිසා බොහෝ සිසුන්ගේ අපේක්ෂාවටවන්නේ

දිස්ත්‍රික් දෙකේ ඇති ජනප්‍රිය ජාතික පාසල් සඳහා යොමුවීමයි.නමුත් එම පාසල්වලට ඇතුලත් විය හැක්කේ පහවසර ශිෂ්‍යත්වය ඉහළින් සමත් සියුන්ට පමණි. එහෙත් අනෙකුත් දක්ෂ දරුවන් සඳහාද සම අවස්ථා සැලසිය යුතු වෙනවා. මීට පිළියමක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාගරික පළාත් පාසල් දෙකක්ද පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් නාගරික පළාත් පාසලක්ද තෝරාගෙන අංග සම්පූර්ණ පහසුකම් සහිත පාසල් ලෙසසංවර්ධනය කිරීමට රුපියල් මිලියන දෙසිය හැත්තෑවක(රු.මි.270) ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

11.9.3මීට සාපේක්ෂව පළාතේ අනෙකුත් පාසල් උසස් තත්ත්වයකට ගෙන ඒම අවශ්‍ය බැවින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගත් පාසල් තිස්තුනක් (33) සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කර ඇති අතර, දෙදහස් දහසය(2016) වර්ෂයේදී මූලික අදියර වශයෙන් රුපියල් මිලියන හැත්තෑපහක් (රු.මි.75) වෙන්කර දීමට මා යෝජනා කරනවා.

11.9.4මීට අමතරව අනෙකුත් පාසල්වල පවත්නා පොදු ගොඩනැගිලි අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් රුපියල් මිලියන හැත්තෑපහක් (රු.මි.75) වෙන්කරනු ලබනවා.

11.9.5ද්විතියික පාසල්වල ප්‍රමාණවත් තරම් ඉඩකඩ ඇති ප්‍රධාන ශාලා නොතිබීම විශාල ගැටළුවක් වී තිබෙනවා. එම ගැටළුවට විසඳුමක් ලෙස ආරම්භයක් වශයෙන් දෙදහස් දහසය (2016) වර්ෂයේදී තෝරාගත් පාසල් දෙකක (02) අංග සම්පූර්ණ ප්‍රධාන ශාලා ඉදිකිරීමට රුපියල් මිලියන පණහක් (රු.මි.50) වෙන් කිරීමට මා යෝජනා කරනවා. ඊට අමතරව අඩක් නිමකළ පාසල් ගොඩනැගිලි සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන සියයක් (රු.මි.100) වෙන් කරනු ලබනවා.

11.9.6 ද්විතියක පාසල් වල පවතින විද්‍යාගාර උපකරණ සහ රසායන ද්‍රව්‍ය මීට වසර ගණනාවක සිට භාවිතා කරන ඒවායි. ඒවා යල්පැනගොස් ඇති බැවින් නවීන උපකරණ සහ රසායන ද්‍රව්‍ය මිළදී ගැනීමසඳහා රුපියල් මිලියන විසිපහක් (රු.මි.25) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

## 11.10 සිසු කුසලතා සංවර්ධනය

11.10.1 ගරු සභාපතිතුමනි, පොත පත දැනුම මෙන්ම නිරෝගී පරපුරක් බිහිකිරීම සඳහා පාසල් සමයේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම අවශ්‍ය වනවා. බොහෝ පාසල් වල අංග සම්පූර්ණ ක්‍රීඩා පහසුකම් නැහැ. නියමු ව්‍යාපෘතියක් වශයෙන් දිස්ත්‍රික් දෙක නියෝජනය වන පරිදි තෝරාගත් පාසල් දෙකක් ක්‍රීඩා පාසල් ලෙසසංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන පණහක් (රු.මි.50) වෙන් කිරීමට මා යෝජනා කරනවා. ඒවගේම සෙසු පාසල්වල ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් ලබාදිය යුතු ක්‍රීඩා උපකරණ හා පහසුකම් සැපයීම සඳහා රුපියල් මිලියන දාහතයි දශම එකක් (රු.මි.17.1) වෙන් කරනු ලබනවා.

11.10.2 ඊට අමතරව දරුවන්ගේ සෞන්දර්ය කුසලතාද වර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වෙනවා. බොහෝ පාසල්වල සෞන්දර්ය ඒකක සඳහා උපකරණ හා ගොඩනැගිලි පහසුකම් සැලසී නැහැ. එම අඩුපාඩුවසම්පූර්ණ කරනුවස් අනුරාධපුර සහ පොළොන්නරුවදිස්ත්‍රික්කවලින් තෝරාගත් පාසැල් හයක (06) සෞන්දර්ය ඒකක සඳහා අංග සම්පූර්ණ පහසුකම් සැපයිම පිණිස රුපියල් මිලියන පණහක් (රු.මි.50) වෙන් කිරීමටත් සෙසු පාසල්වල සෞන්දර්ය උපකරණ අවශ්‍යතාසම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කිරීමටත් මා යෝජනා කරනවා.

11.10.3 ජාතික මට්ටමේ විභාග ඉලක්ක කර ගනිමින් සිසුන්ගේ විෂය දැනුම ඉහළ දැමීම සඳහා විෂය ඉලක්ක කරගත් විශේෂ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මා

බලාපොරොත්තු වෙනවා. ඒසඳහා රුපියල් මිලියන හැත්තෑතුනක් (රු.මි.73) මෙවර අයවැයෙන් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

## 11.11 පාසල්වල පොදු පහසුකම් සංවර්ධනය

11.11.1 ගරු සභාපතිතුමනි, දීර්ඝකාලයකින් ප්‍රතිසංස්කරණයකට ලක් නොවූ පාසල් මෙම පළාතේ තිබෙනවා. එබැවින් දෙමාපිය සහභාගිත්වය ඇතිවසුළු අළුත්වැඩියා කටයුතු කොට නවීකරණය කිරීම සඳහා "පසන් තක්සලාව"වැඩසටහන යටතේ එක් පාසලකට රුපියල් ලක්ෂ පහ(රු.500,000) බැගින් පාසල් අසූව (80) සඳහා රුපියල් මිලියන හතළිහක් (රු.මි.40) වෙන් කිරීමට මා යෝජනා කරනවා. මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අදාල ප්‍රදේශයේ පළාත් සභා මන්ත්‍රීතුමන්ලාගේසහයෝගය ලබා ගැනීමට මා බලාපොරොත්තු වෙනවා.

11.11.2 අධ්‍යාපන සංවර්ධන කටයුතු වඩාත් ඵලදායි හා කාර්යක්ෂමව කිරීම සඳහා කොට්ඨාශ කාර්යාල තුළින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරගත හැකියි. එබැවින් අධ්‍යාපන සංවර්ධන කටයුතු කොට්ඨාශ කාර්යාලයටම පැවරීමට අපේක්ෂා කරනවා. ඒ අනුව ඉදිරි සේවා අවශ්‍යතාවය සලකා බලා දිස්ත්‍රික් දෙකෙහිම කොට්ඨාශ කාර්යාල තිහෙන් විසි එකක් මේ වන විට ඉදිකිරීම් නිම කර ඇති අතර, ඉතිරි නවය (09) ඉදිකර අවසන් කිරීම සඳහා රුපියල් මිලියන හැටහතයි දශම පහක් (රු.මි.67.5) වෙන් කරනු ලබනවා. එමෙන්ම අනුරාධපුර, හිඟුරක්ගොඩ සහ දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාල පරිශ්‍ර නවීන පහසුකම් සහිතවසංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන අනූවක(රු.මි.90) ප්‍රතිපාදනයක් වෙන් කරනු ලබනවා.

11.11.3 පාසල්වල වැට මායිම් නිරවුල් නොවීම නිසා ඇතිවී ඇති අනාරක්ෂිත භාවය අවම කිරීම සඳහා වැට මායිම් නිරවුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මේ වසරේදීත් රුපියල් මිලියන පහක් (රු.මි.05) වෙන්කරනු ලබනවා.

## 11.12 ගුරු සුභසාධනය

11.12.1 දුෂ්කර ප්‍රදේශවල පිහිටි ද්විතියික පාසල්වල ගුරුවරුන් රඳවා ගැනිම සඳහා අත්‍යාවශ්‍යයෙන්ම සංවර්ධනය කළ යුතු ගුරු නිවාස හඳුනා ගෙන එම ගුරු නිවාස අළුත්වැඩියාවසඳහා රුපියල් මිලියන අසූවක (රු.මි.80) ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා.

11.12.2 ගරු සභාපතිතුමනි, මා විසින් මෙතෙක් කරන ලද යෝජනා තුළින් දැනුම කේන්ද්‍රීය අධ්‍යාපනය සඳහා මංපෙත් හෙලි කිරීමට යම් ප්‍රමාණයකින් හෝ ඉඩ සැලසීමට හැකිවේයැයි මා විශ්වාස කරනවා. අධ්‍යාපනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන ගුරු පුරප්පාඩු උසස්පෙළ සමත් පළාතේ රැකියා විරහිත තරුණ තරුණියන් තුන්දහස් පන්සියයකින් සම්පූර්ණ කිරීමට දෙදහස් දහසය වර්ෂයේදී මා කටයුතු කරනවා. මේ සම්බන්ධව පූර්ණ මැදිහත්වීමක් ලබාදුන් අතිගරු ජනාධිපතිතුමාට පළාත් සභාවේ ස්තූතිය පිරි නැමීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

11.12.3 ගරු සභාපතිතුමනි, වර්තමාන විශ්වසමාජය තුළ වැදගත්ම ආයෝජනය වන්නේ දැනුමයි. එබැවින් ඒ සමාජයේ සාමාජිකයකු ලෙස මනා පෞරුෂයක් ඇතිව ක්‍රියා කිරීම තුළින් උතුරු මැද පළාතේ දරුවන්ට අවස්ථා සප්‍රමාණිකවසලසා දීමට මා අපේක්ෂා කරනවා.

## 12.0 පුස්තකාල සංවර්ධනය

12.1 ගරු සභාපතිතුමනි, ප්‍රජාව කියවීමේ පුරුද්දෙන් ඈත්වීම රටේසංවර්ධනයට මහත් බාධාවක් වී ඇත. මේ සඳහා එක් හේතුවක් වී ඇත්තේ සිත් ගන්නා සුළු කියවීම් ශාලා එනම්, පුස්තකාල මේ පළාත තුළ තවමත් සංවර්ධනය වී නොතිබීමයි. එබැවින් කියවීමේ අවස්ථාවන් පුළුල් කිරීම සඳහා ආදර්ශ පුස්තකාල දෙකක් ඉදිකිරීම හා අනෙකුත්

පුස්තකාල සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට මා යෝජනා කරනවා. මේ සඳහා රුපියල් මිලියන තිහක (රු.මි.30) ප්‍රතිපාදන දෙදහස් දහසය (2016) වර්ෂය වෙනුවෙන් වෙන් කර දෙනු ලබනවා.

## 13.0 යෞවන කටයුතු

13.1 පළාතේ පාසල් හැරගිය හා විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන්ට පෞද්ගලික අංශයේ සහ විදේශීය රැකියා සඳහා අවශ්‍ය වන සුදුසුකම් වලින් සපිරි පිරිසක් බිහි කිරීම අරමුණු කොට ගෙනවෘත්තීය පුහුණු පාඨමාලා සහ මාර්ගෝපදේශණවැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනවා. ඊට අමතරව විරැකියාව, මානසික පීඩා හා ආතති කළමනාකරණය කර ගනිමින් අභියෝගවලට මුහුණ දෙන තරුණ පිරිසක් බිහි කිරීම අරමුණු කොට ගෙන ජාතික තරුණ සේවා සභාවසමග ඒකාබද්ධව තරුණ කඳවුරු පැවැත්වීමට කටයුතු කරනවා. මේ සියළු ව්‍යාපෘති සඳහා යෞවන කටයුතු විෂයට රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කරනු ලබනවා.

## 14.0 කාන්තා කටයුතු

14.1 ග්‍රාමීය කෘෂි ආර්ථිකයකින් සමන්විත මෙම පළාතේ ආර්ථිකය නංවාලීමට කාන්තාවගෙන් ලැබෙන දායකත්වය සුළුපටු නොවේ. පවුල් සංස්ථාවසුරකිමින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම අරමුණු කරගත් වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීමට මා අදහස් කරනවා.

14.2 කාන්තා සර්විකරණය හා බලගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට රුපියල් ලක්ෂය බැගින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ විසිනවය (29) සඳහා රුපියල් මිලියන දෙකයි දශම නවයක් (රු.මි.2.9) වෙන් කර දෙනු ලබනවා.

14.3 ස්වාමියා හැරගිය හෝ මියගිය හේතුව නිසා දරුවන් සමඟ අසරණ වූ කාන්තාවන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටිනවා. එම පවුල්වල පාසල් යන වයසේ සිටින දරුවන් ඉතා අසරණව අධ්‍යාපන කටයුතු ඉතා දුකසේ කරගෙන යනවා. එකී පවුල් හඳුනාගෙන ආදායම් උත්පාදන

කාර්යයන්හි එම මවුවරුන් යොමු කිරීම සඳහා දිරිය කාන්තා වැඩසටහන යටතේ රුපියල් මිලියන පහළොවක් (රු.මි.15) වෙන් කරනු ලබනවා.

## 15.0 ක්‍රීඩා කටයුතු

15.1 ක්‍රීඩාව තුළින් කායික මෙන්ම මානසික නිරෝගීතාවය හෙවත් සමබර ජීවන සැලැස්ම තහවුරු කරන අතර, ක්‍රීඩකයින් ලෙසින් ක්‍රීඩාව ප්‍රගුණ කරමින් පළාතට මෙන්ම රටටම කීර්තියක් ලබා දෙමින් රියේ නිමවූ හතළිස් එක්වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ රන් පදක්කම් දහසයක්ද, රිදීපදක්කම් විස්සක්ද, ලෝකඩ පදක්කම් තිස් හතක්ද දිනා ගනිමින් අපේ පළාත පස්වැනි ස්ථානයට පත්වී තිබෙන බව මා සතුටින් ප්‍රකාශ කර සිටිමි.එම පදක්කම් ප්‍රමාණය වැඩිකරමින්ජාතික කෙළබිම ජය ගනිමින් දෙදහස් දහසය වර්ෂයේදී අවම වශයෙන් පළාත් අතරින් තෙවන ස්ථානයට පත්වීමට අප සැලසුම් කළ යුතු වෙනවා. රට අමතරව හා ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ සඳහාද ක්‍රීඩකයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා මතු සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

15.1.1 බර ඉසිලීම, බොක්සිං, කරාටේ, මලල ක්‍රීඩා, ජූඩෝ, ටයි කොන්ඩෝ, රෙස්ලිං දැල්පන්දු, කබඩි, වොලිබෝල්, පිහිණුම්, එල්ලේ, පාපැදි, පාපන්දු, පැසිපන්දු, චෙස් වැනි ක්‍රීඩා ඉසව් සංවර්ධනය සඳහා රුපියල් මිලියන පහළොවක් (රු.මි.15) වෙන් කර දෙනු ලබනවා.

15.1.2 ක්‍රීඩා සමාජ බල ගැන්වීම සඳහා එක් ක්‍රීඩා සමාජයකට රුපියල් පන්දහස බැගින් ක්‍රීඩා සමාජ එක්දහස් එකසියක් (1100) සඳහා රුපියල් මිලියන පහයි දශම පහක් (රු.මි.5.5) වෙන් කරනු ලබනවා.

15.1.3 ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ක්‍රීඩාවේ නවීන තාක්ෂණික දැනුම වර්ධනය හා යාවත්කාලීන කිරීම සඳහා ක්‍රීඩා පුහුණු කඳවුරු

පැවැත්වීම සඳහා රුපියල් මිලියන පහක් (රු.මි.05) වෙන් කරනු ලබනවා.

15.1.4 ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟ වලදී ජයග්‍රහණ ලබා ගැනීම සඳහා ක්‍රීඩකයින් හා පුහුණුකරුවන් විශාල කැපකිරීමක් සිදු කරනු ලබනවා.මේ ජයග්‍රහණ අගය කරමින් ඔවුන් දිරිමත් කිරීම සඳහා රුපියල් මිලියන හතරයි දශම පහක (රු.මි.4.5) ප්‍රතිපාදන ලබා දෙනවා.

15.1.5 ක්‍රීඩා පිටි සංවර්ධනය සහ ක්‍රීඩා සඳහා අවශ්‍ය වන විශේෂ උපකරණ ලබා ගැනීම සඳහා රුපියල් මිලියන විස්සක (රු.මි.20) ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා.

## 16.0 සංස්කෘතික හා ආගමික කටයුතු

16.1 ශ්‍රී ලාංකීය සංස්කෘතියේ ආරම්භය සනිටුහන් කරන ලද උතුරු මැද පළාත තුළ ආගමික සහජීවනය මෙන්ම සංස්කෘතික පුනර්ජීවනයක් ඇති කරමින් ආගමික හා කලා ක්ෂේත්‍ර වෙනුවෙන් සුවිශේෂී සේවාවක් ඉටු කිරීම මෙම පළාත් සභාවේ වගකීමයි. එම වගකීම ඉටු කිරීම සඳහා රුපියල් මිලියන හතළිස් හතක් (රු.මි.47) වෙන් කරමින් මතු සඳහන් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටමා කටයුතු කරනවා.

16.1.1 උතුරු මැද පළාතේ ප්‍රාදේශීය මට්ටමින් කලා කරුවන් නඟා සිටුවීම සඳහා ප්‍රාදේශීය සභා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒකාබද්ධවපවත්වනු ලබන ප්‍රාදේශීය සංස්කෘතික උළෙලවල් සඳහාත්, පළාතේ කලාකරුවන් ජාතික තලයට රැගෙනයාම අරමුණුකරගත් වාර්ෂික කලා උළෙල වියිහත්වන වරටත් දෙදහස් දහසය වර්ෂයේදී පැවැත්වීම සඳහාත්,රුපියල් මිලියන එකොළහක (රු.මි.11) ප්‍රතිපාදනයක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

16.1.2 පළාතේ නර්තන හා ගායන ශිල්පීන්ගේ හැකියා වර්ධනය වෙනුවෙන් අවශ්‍ය භෞතික හා අනෙකුත් පහසුකම් සැපයීම සඳහා රුපියල් මිලියන පහක්(රු.මි.05) වෙන් කරනු ලබනවා.

16.1.3 අතීතයේ සිට පැවත එන සාම්ප්‍රදායික සංස්කෘතික වටිනාකම් සංරක්ෂණය කිරීම අරමුණුකරගෙන පවත්වන සාම්ප්‍රදායික උත්සවසඳහා රුපියල් මිලියන පහක (රු.මි.05) මුදලක් වෙන් කරනු ලබනවා.

16.1.4 දැහැමි සමාජයක් පළාත තුළ ගොඩනැගීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දීම වෙනුවෙන් සංවිධානය කරනු ලබන පළාතේ ආගමික උත්සව, පෙරහැර, පොහෝ දින වැඩසටහන්, සඳහා හා ප්‍රමාණවත් පරිත්‍යාග නොලැබෙන ආගමිකස්ථානවල සංවර්ධනය සඳහාත්,රුපියල් මිලියන පහළොවක් ද(රු.මි.15) පළාතේ දරුවන්ගේ අධ්‍යාත්මික ගුණාංග වර්ධනය සඳහා දහම් පාසල් සංවර්ධනයට රුපියල් මිලියන දහයක් ද (රු.මි.10) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

## 17.0 සෞඛ්‍යය

17.1 ගරු සභාපතිතුමනි, පළාත් සභාවලට බලය පැවරීමත් සමඟම උතුරු මැද පළාතේ ශික්ෂණ රෝහල් සහ විශේෂ ප්‍රතිකාර සඳහා පිහිටුවන රෝහල් හැර අනෙකුත් ප්‍රධාන රෝහල්, ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාසසහ බෙහෙත් ශාලාවල පරිපාලන කටයුතු සහ මහජන සෞඛ්‍ය සේවාවන් පළාත් සභාවලට පැවරී තිබෙනවා.ජාතික වශයෙන් හඳුනාගත් නිර්ණායකවලට අනුවරෝග නිවාරණ සේවාව, ප්‍රතිකාරක සේවා සහ පුනරුත්ථාපන සේවාව පළාතේ සමස්ත ප්‍රජාව වෙනුවෙන් අප කැපවී සිටිනවා. මෙම සේවාව ලබාදීමේදී භෞතික පහසුකම් වල හිඟකම, මානවසම්පත්වල හිඟකම සහ තිබෙන මානවසම්පත්වල කුසලතාවයන්ගේ අඩුකමක් දක්නට ලැබෙනවා. මෙවර අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේදී මෙම කරුණු පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු වෙනවා.

17.2 ගරු සභාපතිතුමනි, මේතාක්කල් අප කළේ භෞතික සම්පත් වැඩිදියුණු කිරීමේදී සුළු පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටුකරමින් සමස්ත රෝහල් පද්ධතියේ අළුත්වැඩියා සඳහා ප්‍රමුඛතාවය දීමයි. මේ නිසා එකඳු

රෝහලක්වත් පරිපූර්ණ සෞඛ්‍ය සේවාවක් ලබාදීමට (Comprehencesive health care service) අපොහොසත් වී තිබෙනවා. එනිසා රෝහල් සංවර්ධනයේදී මෙතෙක් අනුගමනය කරන ලද ක්‍රමවේදය වෙනුවට රෝහල් සංවර්ධනය විධිමත් සැලැස්මකට අනුවසිදු කිරීමට දෙදහස් දහසය වර්ෂයේ සිට අපි කටයුතු කරනවා. මේ සඳහා ආදර්ශයක් ලෙස තඹුත්තේගම හා මැදිරිගිරිය රෝහල් සඳහා මූලික සැලසුම් (Master Plan) මේ වන විටත් සකස් කර තිබෙනවා. අනෙකුත් රෝහල් සඳහාද මූලික සැලසුම් සකස් කරමින් පවතිනවා. දෙදහස් දහසය (2016) වර්ෂයේ සංවර්ධනය සඳහා තඹුත්තේගම, පදවිය, කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, විලච්චිය, ගලෙන්බිදුණුවැව, බකමූණ, මැදිරිගිරිය, වැලිකන්ද, අරලගංවිල යන රෝහල් දහය (10) තෝරාගෙන තිබෙනවා. එම රෝහල්වල ගොඩනැගිලි හා උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කර ඉහළ ගුණාත්මකභාවයෙන් (Improvement of quality and safety health care) යුත් සෞඛ්‍ය සේවාවක් ජනතාවට ලබාදීමට කටයුතු කරනවා. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන දෙසිය හැටක් (රු.මි.260) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

17.3 අප මෙම රෝහල් සේවාවවැඩිදියුණු කළද, ගරු සභාපතිතුමනි, රෝග වැළැක්වීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් දිය යුතු වෙනවා. ජනතාවට තම සේවාව ඉතා ආසන්න අවම පිරිවැයකින් සහ අංග සම්පූර්ණ ලබාගත හැක්කේ ප්‍රාදේශීය මට්ටමේ පවතින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වලින්ය. නමුත් ප්‍රජාවට ගුණාත්මක සේවාවක් සැපයීමට සරිලන පරිදි බොහෝ කාර්යාලවල ඉඩකඩ පහසුකම් සහ උපකරණ ප්‍රමාණවත් පරිදි නැහැ. සමහර ගොඩනැගිලි අවුරුදු පණහකටත් (50) වඩා පැරණි වන අතර, කාලයක් තිස්සේ නිසි අළුත්වැඩියාවන්ට ලක්වී නැහැ. දැනට පවතින සමහර වෛද්‍ය නිලධාරී කාර්යාල ප්‍රතිලාභීන්ගෙන් බොහෝ දුරස්ව පවතිනවා. එබැවින් දෙදහස් දහසය වර්ෂයේදී විලච්චිය, නැගෙනහිර නුවරගම් පළාත, කහටගස්දිගිලිය,මැදවච්චිය,මැදිරිගිරිය,සිරිපුර,වැලිකන්ද, යන ප්‍රදේශවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හතක් අංගසම්පූර්ණව අළුතින් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන සියයක්ද, (රු.මි.100) අත්‍යාවශයෙන්ම අළුත්වැඩියා කළ යුතු තත්වයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හඳුනාගෙන එම කාර්යාල අළුත්වැඩියා කිරීම සඳහා

රුපියල් මිලියන පණහක්ද (රු.මි.50) ඇතුළුව රුපියල් මිලියන එකසිය පණහක (රු.මි.150) ප්‍රතිපාදන මෙම වැඩසටහන සඳහා වෙන් කිරීමට මා යෝජනා කරනවා.

17.4 රෝගී සත්කාර සේවාවේදී ග්‍රාමීය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාදේශීය රෝහල් සහ මධ්‍යම බෙහෙත්ශාලා (Primary Medical Care Centers) සඳහා රුපියල් මිලියන එකසිය තිහක් (රු.මි.130) මවිසින් වෙන් කර දී ඇති අතර, රෝග නිවාරණ කටයුතු සඳහා ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන (Village Health Centers) ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන පණහක් (රු.මි.50) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

17.5 රෝග නිවාරණ කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පළාත තුළ පිහිටි සුවසහන කමිටු භාරසිය හැටක්(460) ප්‍රතිසංවිධානය කර බලගැන්වීමටත්, පාසැල් සෞඛ්‍ය ප්‍රවර්ධනය තේමා කර ගනිමින් ආරම්භ කරන ලද "පැහැසර යෞවනය"වැඩසටහන මගින් පළාත පුරා දරුවන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනයට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් රුපියල් මිලියන හතක (රු.මි.07) ප්‍රතිපාදන වෙන් කරනු ලබනවා.

17.6 පළාත තුළ සේවයට පැමිණෙන වෛද්‍ය නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලවල පොදු පහසුකම් ශක්තිමත් කිරීම සඳහා නිල නිවාස අළුත්වැඩියා හා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන හතළිස් දෙකක(රු.මි.42) ප්‍රතිපාදන වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

17.7 රෝහල්වල කසල බැහැර කිරීමට විධිමත් ක්‍රමවේදයක්නොමැතිවීම පාරිසරික මෙන්ම සෞඛ්‍ය ගැටළුවලට හේතුවන්නක් බැවින් රෝහල්වල විධිමත් කසල කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන දහයක(රු.මි.10) ප්‍රතිපාදන වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

17.8 පළාතේ රෝහල් ඇතුළු සෞඛ්‍ය ආයතන වල මායිම් නිරවුල් නොවීම නිසා නොයෙක් ගැටළුකාරී තත්වයන් මතුවී තිබෙනවා. එය මග හරවා ගැනීම සඳහා වැට මායිම් ලකුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රුපියල් මිලියන දහයක් (රු.මි.10) වෙන් කිරීමට කටයුතු කරනවා.

17.9 එපමණක් නොව ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතේ වෙසෙන ජනතාවගේ දෙපතුල ළඟට (Door Step Healthcare) සෞඛ්‍ය සේවාව ලබාදීමේ අරමුණින් සුවනාරි සෞඛ්‍ය අධ්‍යාපන සේවයක් මෙන්ම දන්ත ශල්‍ය වෛද්‍ය සේවයක් ජංගම රථ මගින් ලබා දීමට රුපියල් මිලියන දහතුනයි දශම පහක (රු.මි.13.5) ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

17.10 ගරු සභාපතිතුමනි, පළාත තුළ සෞඛ්‍ය නිලධාරීන්ගේ පුහුණු කටයුතු සඳහා මධ්‍යස්ථානයක අවශ්‍යතාවය කාලයක සිට පැවත එන්නක්. මෙයට පිළියමක් වශයෙන් අනුරාධපුර නගරය තුළ සෞඛ්‍ය නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට බලාපොරොත්තු වනවා. ඒ සඳහා දෙදහස් දහසය වර්ෂයේදී රුපියල් මිලියන විස්සක් (රු.මි.20) වෙන් කිරීමට මා යෝජනා කරනවා. ඊට අමතරව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන විසිපහක් (රු.මි.25) වෙන්කරනු ලබනවා.

17.11 ගරු සභාපතිතුමනි, ඉහත හඳුනා ගන්නා ලද වැඩසටහන් දෙදහස් දහසය (2016) මුදල් ප්‍රකාශයට ඇතුළත් කිරීම යෝග්‍ය වූ බැවින් කෙටුම්පත් මුදල් ප්‍රකාශයේ එකසිය විසිතුන, එකසිය විසිහතර සහ එකසිය විසිපහ පිටුවලට අදාළ සංශෝධනයන් මේ සමඟ ඉදිරිපත් කරඇත.

17.12 දෙදහස් දහසය (2016) වසරේ උතුරුමැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමස්ත ආයෝජනය රුපියල් මිලියන හාරදහස් එකසිය හැත්තෑ අටයි දශම අටයි එකයි අටක් (4178.818) වන අතර මූලධන ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන නවසිය විසි හයයි දශම එකක (926.1) මුදලක් හා පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන තුන්දහස් දෙසිය පනස් දෙකයි දශම හතයි එකයි අටක (3252.718) මුදලක් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වෙනවා. පසුගිය වර්ෂය හා සසඳන විට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මුළු ආයෝජනය සියයට තිස් හතරයි දශම හතයි අටක(34.78%)වැඩිවීමක් බව මා සතුටින් ප්‍රකාශ කරන්න කැමතියි.

## 18.0 දේශීය වෛද්‍ය සේවාව

18.1 සොබා දහමට අනුකූල වූ වෛද්‍ය ප්‍රතිකාර කෙරෙහි නැඹුරුව විශාල වශයෙන් වැඩිවෙමින් පවතිනවා. රෝග නිවාරණය හා ප්‍රතිකාර සේවා සඳහා පාරම්පරික වෛද්‍ය ක්‍රම ශක්තිමත් කරමින් පළාතේ ජනතාවට ගුණාත්මක සේවාවක් ලබාදීම කළ යුතු වෙනවා. ඒසඳහා භෞතික හා මානවසම්පත් ලබාදී ආයුර්වේදය ශක්තිමත් කිරීම අරමුණු කරගෙන දෙදහස් දහසය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර දීමට බලාපොරොත්තු වෙනවා.

18.2 ඒ අනුව ඉපලෝගම, විලච්චිය, හා මැදිරිගිරිය මධ්‍යම බෙහෙත් ශාලා අලුතින් ඉදි කිරීමටත්, තඹුත්තේගම රෝහලේ පිරිමි වාට්ටුවේ වැඩ නිම කිරීමටත්, කැබිතිගොල්ලෑව, මැදවච්චිය, ඇලයාපත්තුව, මධ්‍යම බෙහෙත් ශාලා ඉදි කිරීමේ කටයුතු නිම කොට ජනතා අයිතියට පත් කිරීමටත් බලාපොරොත්තු වෙනවා. විශාලතම ආයුර්වේද රෝහල් දෙකවන අනුරාධපුර ආයුර්වේද රෝහලේ සහ මින්නේරිය ආයුර්වේද රෝහලේ නවීකරණ කටයුතු දෙදහස් දහසය වර්ෂයේ (2016)නිම කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙම සියළු ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන හැත්තෑ හයක (76) ප්‍රතිපාදන වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

18.3 අනුරාධපුර ආයුර්වේද රෝහලේ සහ මින්නේරිය ආයුර්වේද රෝහලේ වෛද්‍යවරුන්ගේ හා අනෙකුත් කාර්ය මණ්ඩලවල නිල නිවාස දිගු කාලයකින් අලුත්වැඩියා කර නොමැති නිසා එය අත්‍යාවශ්‍ය කරුණක් සේ සලකා අදාල අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් මිලියන දහයක් (10) වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

18.4 දෙදහස් දහසය වර්ෂයේ (2016) පාරම්පරික වෛද්‍යවරු දිරි ගැන්වීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ අනුව වෛද්‍යවරුන්ගේ අඩුපාඩු සහිත ප්‍රතිකාර මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීමටත්, ප්‍රතිකාර ලබා දීම පහසු කරවීම සඳහා පාරම්පරික වෛද්‍යවරුන්ගේ බෙහෙත් අලෙවි සැලක් හා පෝෂණ මන්දිරයක් බැදිවැව පුලතිසි පාරම්පරික වෙද මැදුර පරිශ්‍රයේ ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා.මේ සඳහා රුපියල් මිලියන පහයි දශම පහක (රු.මි.5.5) ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

18.5 පළාතේ ඖෂධ අවශ්‍යතාව පළාත තුළම නිෂ්පාදනය කර ගැනීමේ බලාපොරොත්තුවෙන් පළාතේ ඖෂධ නිෂ්පාදනාගාරයක් තඹුත්තේගම තෙල්හිරියාව ප්‍රදේශයේ දැනටමත් සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඊට අවශ්‍ය ඖෂධ අමුද්‍රව්‍ය ලබා ගැනීමට ඔසු උයන් සංවර්ධනය කිරීමටත්, ආයුර්වේද ආදර්ශ ගම්මාන හරහා ඔසු ගොවීන් ඇති කර ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, ආයුර්වේද ප්‍රවර්ධන සමාජ සඳහා බෝ නොවන රෝග පාලනය කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රුපියල් මිලියන අටක (08) ප්‍රතිපාදන වෙන් කර දීමට බලාපොරොත්තු වෙනවා.

## 19.0 සමාජ සුභසාධන

19.1 සමාජයෙන් පිළිසරණක් නොලද හෝ අනාථ භාවයට පත්වී ඇති සහසමාජ රැකවරණය අවශ්‍ය අයට නියි ආරක්ෂාවසැලසීමේ වගකීම පළාත් සභාව වෙත පැවරී තිබෙනවා. ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයෙන් සියයට හතරයි දශම හතක් (4.7%) ජීවත්වන්නේ උතුරු මැද පළාතේ. මෙම ජනගහනය වැඩිවීමේ ජාතික මට්ටමේ ප්‍රවණතාවය මත වැඩිහිටියන් රැකබලා ගැනීම, පවුල තුළ හා සමාජය තුළ වැඩිහිටියාන්සඳහා රැකවරණයසැලසීමසාමාජ්‍ය වගකීමක් වෙනවා. එම සාමාජ්‍යවගකීම ඉටු කරන අතරම පිළිකා, ලාදුරු, තැලසීමියා, බරවා, ක්ෂය රෝගය වැනි රෝගයන්ගෙන් පීඩාවට ලක්වූවන්ට පිළිසරණවීමත්, කිසිවෙකුගේ රැකබලා ගැනීමක් නොමැතිව අසරණභාවයට පත් තැනැත්තන්ට මූල්‍ය ආධාර සැපයීමත්වැනි සමාජ සුභ සාධන වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක කරනවා. මෙම සේවාවන් දෙදහස් දහසය වර්ෂයේ වඩාත් පුළුල්ව ලබාදීම පිණිසමතු සඳහන්ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා දීමට කටයුතු කරනවා.

19.2 සාලියපුර සහ ගිරිතලේ වැඩිහිටි නිවාස දෙක සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන දාහතරක් ද (රු.මි.14) බුල්නෑව ආබාධිතයන්ගේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ලෙසවැඩිදියුණු කිරීමසහ ඇලගමුව හා ඔළුකරඳ ආබාධිත රැකවරණ මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමසඳහා රුපියල් මිලියන හතක (රු.මි.07) ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා.

19.3 ලාදුරු, තැලසීමියා, බරවා, ක්ෂයරෝග සඳහා ගෙවන ලද රුපියල් පන්සියයක මාසික රෝගාධාර දීමනාවරුපියල් තුන්දහස(රු.3,000) දක්වාත්, පිළිකා රෝගය සඳහා ගෙවන ලද රුපියල් පන්සියයක (රු.500) මාසික රෝගාධාර දීමනාවරුපියල් එක්දහස් පන්සියය (රු.1,500) දක්වාත්,රුපියල් අටසියයක(රු.800/-) පූර්ණාබාධ මාසිකආධාර මුදලරුපියල් තුන්දහස (රු.3,000) දක්වාත්, වැඩිකර ගෙවීමට මා යෝජනා කරනවා.

19.4 මීට අමතරවවකුගඩු රෝගය හේතුවෙන් ආධාර ලබමින් සිටි රෝගියා මියගිය පසු දැනට රේඛීය අමාත්‍යංශය මගින් ගෙවනු ලබන රුපියල් තුන්දහසක (රු.3000/-) රෝගාධාර මුදල නතර කිරීමට ලක්වනවා. නමුත් රෝගාධාර ලබමින් සිටි පුද්ගලයා මියගියත් එම ආධාර මුදල නොනවත්වා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අවසන් වන තෙක් එම පවුල් ඒකක වෙත පළාත් සභා අරමුදලෙන් ගෙවීමට මා යෝජනා කරනවා.

19.5 උතුරු මැද පළාතේ ප්‍රබල ව්‍යසනයක්ව පවතින වකුගඩු රෝගයට ලක්ව නිතිපතා රුධිර කාන්දුකරණය සඳහා දුරබැහැර සිට අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත පැමිණෙන රෝගීන්ට පහසුවෙන් එකී කටයුතු කරගැනීම සර්වෝදය මධ්‍යස්ථානයේ දෙදහස් පහළොව(2015) වර්ෂයේ ආරම්භ කරන ලදසත්කාරක පියසවඩාත් පුළුල් පහසුකම් සහිතව පවත්වාගෙන යාම සඳහා මෙවර අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා. ඊට අමතරව සෞඛ්‍ය කටයුතු පිළිබඳ රේඛීය අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ පුළුල් පහසුකම් සහිත සත්කාරක පියසක් ඉදිකිරීමට කටයුතු කරනවා.

19.6 ගරු සභාපතිතුමනි, මවිසින් ඉහත සඳහන් කළ මූලධන ප්‍රතිපාදන වලට අමතරවයියළුම සුභසාධන ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන තුන්සියයක (රු.මි.300) ප්‍රතිපාදනයක් වෙන් කර දෙනු ලබනවා.

## 20.0 පරිවාස හා ළමා රක්ෂක සේවා

20.1 පළාතේ සියලු දරුවන්ගේ අනාගතයසුරක්ෂිත කිරීමත්,සුලු වැරදි වලට යොමු වූ ළමුන් විශෝධනය කරසමාජ ගත කිරීමත්, අපගේ ප්‍රධාන වගකීමක්වෙනවා. නිවාසගත දරුවන් සමාජගත කිරීම සඳහා ඔවුන්ගේ දැනුම හා කුසලතාවයන් වර්ධනය කළ යුතු වෙනවා. දැනට සිටින නිවාසගත දරුවන් තුන්සිය දහයකගේ (310) විෂයානුබද්ධ කුසලතා ඉහල නැංවීම සහ දෙමළ, ඉංග්‍රීසි සහ පරිගණක විෂය දැනුම වර්ධනය කිරීමසඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස රුපියල් මිලියන දෙකයි දශම පහක් (රු.මි.2.5)වෙන් කරනු ලබනවා.

20.2 රට අමතරවපරිවාසිකයින් ස්වයංරැකියා සඳහා යොමු කිරීම, නිවාසගත කිරීම් අවම කිරීම සඳහා ස්වයංරැකියා ආධාර ලබාදීම, පරිවාසකයින් දැනුවත් කිරීම යන සියළු කටයුතු සඳහා රුපියල් මිලියන දෙකක් (රු.මි.02) වෙන් කර දීමට මා යෝජනා කරනවා.

20.3 ළමා නිවාසවල පොදු පහසුකම් ඉතාම අඩු මට්ටමක පවතිනවා. දරුවන්ට සුදුසු පරිසරයක් නිර්මාණය කළයුතු වෙනවා. ඒ නිසාළමානිවාසවල අළුත්වැඩියාවන් සහ එම නිවාසවලට ක්‍රීඩා හා පරිගනක වැනි උපකරණ ලබාදීම සඳහාත්රුපියල් මිලියන විසිහතරයි දශම එකක (රු.මි.24.1) ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කරනවා.

20.4 දැනට වසා දමා ඇති කිරිකෙටු වැව පාසල ප්‍රතිසංස්කරණය කර පිරිමි දරුවන් සඳහා සහතික කල පාසලක් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන අටක්ද (රු.මි. 08) වෙන් කරනු ලබනවා.

20.5 දිනෙන් දින වැඩිවෙන ළමා අපයෝජන ප්‍රමාණවැළැක්වීමසඳහා ග්‍රාමීය හා දිස්ත්‍රික් ළමාරක්ෂක කමිටු සවිබල ගැන්වීමටත්, පාසැල් ළමුන් දැනුවත් කිරීමටත්, පොලිස් ළමා හා කාන්තා කාර්යංශයට පරිගණක ලබාදී ළමා අපචාර පිළිබඳ දත්ත පද්ධතියක් ඇති කිරීමත් යන වැඩසටහන් සඳහා රුපියල් මිලියන හතරයි දශම නවයක් (රු.මි.4.9) වෙන් කර දෙනු ලබනවා.

## 21.0 සාමාන්‍ය පරිපාලනය සහ ආයතන කටයුතු

21.1 පළාත් පරිපාලනයේදී ප්‍රධාන ලේකම් කාර්යාලය පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන විශාල මෙහෙවරක් ඉටු කරනවා. මෙම ආයතනවල කාර්ය පුනරාවර්තන වියදම් සහ නඩත්තු කටයුතු වෙනුවෙන් මෙම අයවැයෙන් ප්‍රතිපදාන වෙන් කර දී තිබෙනවා.

21.2 පළාත් සභාවේ සාමාන්‍ය පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා කාර්යාල ගොඩනැගිලිවල හිඟතාවයක් තිබෙනවා. පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන හා විමර්ශණ දෙපාර්තමේන්තුව යන ආයතන සඳහා කාර්යාල ගොඩනැගිලිවල අවශ්‍යතාවය පවතිනවා. එම අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට ඉංජිනේරු දෙපාර්තේමින්තුව මගින් කටයුතු කරනවා. අළුතින් ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි සංකීර්ණයට සහ මෙම ගොඩනැගිලි සංකීර්ණයේ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන අසූ හතරයි දශම හතරක (රු.මි.84.4) ප්‍රතිපාදන සලසාදීම යෝජනා කරනවා.

21.3 මෙම පළාතේ නිලධාරින් බොහොමයක් පිට පළාත් වලින් පැමිණ රාජකාරි කටයුතුවල නියැලෙන නිසා ඔවුන්ගේ පහසුවසඳහා නිල නිවාස ලබාදීමේ අවශ්‍යතාවය පවතිනවා. එම නිසා මෙම අයැවැය තුළින් අළුතින් නිල නිවාස හතරක් ඉදිකිරීමට රුපියල් මිලියන විසිපහයි දශම පහක් (රු.මි.25.5)වෙන් කිරීමට මා යෝජනා කරනවා.

21.4 පළාත් සභාව යටතේ ඇති සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය ස්වයං ආදායම් උත්පාදිත ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වෙනවා. මෙම ආයතනය පසුගිය මාස නවය (09) තුළ මිලියන තිස් දෙකයි දශම පහක (රු.මි.32.5) ආදායමක් උපයා තියෙනවා. මෙම ආයතනයේ මුද්‍රණාලය ලාභදායි අංශයක් විදියට දියුණු කළ හැකිව තිබෙනවා. මුද්‍රණාලයේ සංවර්ධන කටයුතු සඳහාත් පරිපාලන ගොඩනැගිල්ලේ අදාළ සංවර්ධන කටයුතු සඳහාත් රුපියල් මිලියන විස්සක (රු.මි.20) ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

21.5 ගරු සභාපතිතුමනි, පළාතේ මුළු ආදායමට මෝටර් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම තුළින් සියයට දහසයක දායකත්වයක් ලබා දෙනවා. මෙම කාර්යය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පළාත් සභාව වෙනුවෙන් ඉටු කරනවා. මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලබාදී ඇති බොහෝ පරිගණක වර්ෂ පහකටත් වඩා පැරණි ඒවාය. ඒනිසා අක්‍රියවීම් බහුලවවාර්තා වෙනවා. මෝටර්රථ ප්‍රවාහන ආදායම් ලබාදීම කාර්යක්ෂම කිරීම සඳහා පරිගණක හා ඊට අදාළ උපකරණ ලබාදීම සඳහා රුපියල් මිලියන දෙකයි දශම නවයක් (රු.මි.2.9) වෙන් කිරීමට මා යෝජනා කරනවා.

## 22.0 නීතිය, සාමය හා සංහිඳියාව

22.1 ගරු සභාපතිතුමනි, පළාතේ නීතිය හා සාමය පවත්වාගෙන යාම ව්‍යවස්ථානුකූල වගකීමක් වනවා. ළමා අපචාර, මත්ද්‍රව්‍ය සඳහා යොමුවීම සහ වෙනත් සමාජ විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම කළයුතු වෙනවා. ඒ අතරම ගැටුම් අඩු සාමකාමී සමාජයක් ඇති කිරීමේ වගකීමද ඉටු කළ යුතු වෙනවා. මේ සඳහා හඳුනාගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබනවා.

22.2 පළාත් සභාවේ නීති අංශයක් නොතිබීම නිසා ඉතා සුළු කරුණු වලදී පවා නීතිඥයින්ගේ සහයපැතිමට සිදුවී තිබෙනවා. ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම සහ නීති සහාය ලබාගත හැකි නිලධාරීන් අනුයුක්ත කර සේවාව පහසුවෙන් ලබාගත හැකිවන පරිදි පළාත් සභාවේ නීති අංශයක් පිහිටුවීමට මා යෝජනා කරනවා.

22.3 ඉහත සඳහන් වැඩසටහන් දෙක සඳහා රුපියල් මිලියන පහක් (රු.මි.05) මෙවර අයවැයෙන් වෙන් කිරීමට මා කටයුතු කරනවා.

## 23.0 මානවසම්පත් කළමනාකරණය

23.1 ගරු සභාපතිතුමනි, උතුරු මැද පළාතට අවශ්‍ය පළාත් රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම, පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, සේවයෙන් පහකිරීම හා විනය පාලනය වැනි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුකාර කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවසහ

ප්‍රධාන ලේකම් කාර්යාලයඅනෙකුත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවලට අවශ්‍ය සහාය ලබාදෙමින්ක්‍රියාත්මක වනවා.

23.2 පළාත් රාජ්‍ය සේවයේ දැනට විසිතුන්දහස් එකසිය හැට අටක් (23,168) සේවය කරනවා. ඔවුන්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා රුපියල් මිලියන දහතුන්දහස් හාරසිය හතළිස් හතක් (රු.මි.13,447) දෙදහස් දහසය (2016) වර්ෂයට වෙන් කර දී තිබෙනවා. පළාත් රාජ්‍ය සේවයේ මානවසම්පත් නිසි අයුරින් කළමනාකරණය කරමින් පළාතේ සංවර්ධනයට ඔවුන්ගේ උපරිම දායකත්වය ලබා ගැනීමට මා කටයුතු කරනවා.

23.3 පළාත් රාජ්‍ය සේවයේ දැනට පුරප්පාඩු පන්දහස්දෙසිය හැත්තෑ එකක් (5,271) තිබෙනවා. එම පුරප්පාඩු වලින් ගුරු පුරප්පාඩුද ඇතුළුව හාරදහස් අටසිය හැත්තෑ අටක් (4,878) බඳවා ගැනීමට දැනට කටයුතු කරමින් පවතිනවා. ඉතිරි පුරප්පාඩුද දෙදහස් දහසය (2016) වර්ෂයේදී සම්පූර්ණ කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඊට අවශ්‍ය ප්‍රතිපාදන දෙදහස් දහසය(2016) වර්ෂයේදී අතිරේක ප්‍රතිපාදනයක් ලෙස ලබා ගැනීමට මා අදහස් කරනවා.

23.4 පළාත් රාජ්‍ය සේවයේ නියුතු විසිතුන්දහස් එකසිය හැට අටක (23168) නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පළාත් කළමණාකරන පුහුණු ඒකකය සහ අධ්‍යාපන සංවර්ධන සම්පත් මධ්‍යස්ථානය ක්‍රියා කරනු ලබනවා. මේ සා විශාල නිලධාරීන් සංඛ්‍යාවක් පුහුණු කිරීම සඳහා මෙම ආයතන දෙකේ ධාරිතාව ප්‍රමාණවත් වන්නේ නැ ඒ නිසා පළාත් සභාවේ දැනට ඉදිවෙමින් පැවති පුහුණු ඒකකයේ ඉදිකිරීම් කටයුතු නිම කර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා යොදවා ගැනීමට මා අපේක්ෂා කරනවා. අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම මඟින්මධ්‍යම රජයේ ප්‍රතිපාදන ලබා ගැනීමට මා බලාපොරොත්තු වෙනවා.

## 24.0 සැලසුම්කරණය සහ ව්‍යාපෘති කළමනාකරණය

24.1 පළාතේ සංවර්ධනය නව මඟකට යොමු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිඵලපාදක සංවර්ධන සැලසුම් (Result Base Planning) සකස් කිරීම සඳහා අවශ්‍ය වන දත්ත පද්ධතියක අවශ්‍යතාවය දැඩි වශයෙන් තිබෙනවා. පළාතේ සාමාජ්‍ය සහ ආර්ථික තොරතුරු පිළිබඳ නිවැරදි දත්ත ලබා ගැනීමේ ගැටළුවක් තිබෙනවා. එයට විසඳුමක් වශයෙන් දෙදහස් දහසය වර්ෂයේදී (2016) ප්‍රධාන ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ අංග සම්පූර්ණ සංඛ්‍යාලේඛන අංශයක් පිහිටුවීමට මා යෝජනා කරනවා. මේ සඳහා දැනටමත් පවතින මානව හා භෞතික සම්පත් යොදා ගැනීමට බලාපොරොත්තු වෙනවා.

24.2 පළාතක් තිරසාර සංවර්ධනය කරා යොමු කිරීමේදී පර්යේෂණ අංශයක වැදගත්කම පැහැදිලිව පෙනෙනවා. බාහිර පාර්ශවයන්ගේ විශේෂඥ දැනුම සහ කුසලතාවය ලබා ගෙන පළාත සංවර්ධනය කරා මෙහෙයවිය හැකි පරිදි පර්යේෂණ අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනවා.

24.3 බොහෝ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම පමාවීම නිසා අදාළ මුදල් වර්ෂය තුළ ඒවා නිම කිරීමට නොහැකිවී ඇති අවස්ථා කොතෙකුත් දැක තිබෙනවා. ව්‍යාපෘති අනුමත කිරීම හා අධීක්ෂණ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වන අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධාන වගකීමයි. එම වගකීම ඉටු කිරීමේ වගකීම ශක්තිමත් කිරීම සඳහා පළාතේ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිපාදන අමාත්‍යාංශවැය ශීර්ෂ යටතේ සලසනු ලැබුවා. දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඉදිරිපත් කරනු ලබනව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කිරීමෙන් පසු සුදුසු පරිදි ප්‍රතිපාදන බෙදා හැරීමේ ක්‍රමයක් සකස් කරනවා. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ එක් එක් ආයතන විසිරී කටයුතු කරනවා වෙනුවට අමාත්‍යාංශ ලේකම් වරයාට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ බැඳීමක් ඇති කිරීමත් ප්‍රධාන ලේකම්වරයාට අනෙකුත් ලේකම්වරුගේ බැඳීමක් ඇති කරමින් සංවර්ධන කාර්යයේදී අවශ්‍ය වගවීම (Accountability) ස්ථාපිත කිරීමයි. මෙම ක්‍රියාවලිය තුළින් සැලසුම් කරන ලද ව්‍යාපෘති මුල් කාර්තුව තුළදීම ආරම්භ කිරීමට කටයුතු කළ හැකිවේයයි මා විශ්වාස කරනවා.

## 25.0 මූල්‍ය කළමනාකරණය

25.1 නිසි මුදල් කළමනාකරණයක් මගින් සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ගැනීමට හැකිවෙනවා. ප්‍රශස්ථ මුදල් කළමනාකරණයක් කිරීම සඳහා පවතින මූල්‍ය රීති ප්‍රමාණවත් නොවේ නම් මූල්‍ය රීති හා පටිපාටි හඳුන්වාදීමටබලාපොරොත්තු වෙනවා.

25.2 පළාත් සභාවේ ප්‍රඥප්ති යටතේ පිහිටුවා ඇති ආයතනවල ගිණුම් කටයුතු මනා ලෙස මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (Sri Lanka Accounting Standard) හඳුන්වාදීමට කටයුතු කරනවා. ඒ පිළිබඳව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට දැනුම ලබාදීමට කටයුතු කරනවා.

25.3 ගරු සභාපතිතුමනි, පළාත් සභාවසතු වත්කම් ඕනෑම වේලාවක බලාගත හැකි වන පරිදි වත්කම් ලේඛනයක් අප දැනට සකස්කර තිබෙන බව මේ අවස්ථාවේදී ඉතාම සතුටින් ප්‍රකාශ කරන්න කැමතියි. පළාත් සභා පරිපාලනය යටතේ ඇති අමාත්‍යංශ,දෙපාර්තමේන්තු, පාසැල්, වෛද්‍ය ආයතන ඇතුළු ආයතන එක්දහස් දහනවයක වත්කම් ඕනෑම වෙලාවක බලාගත හැකිවන පරිදි ජාලගත කරන ලද වත්කම් කළමනාකරණ වැඩසටහනක්(Assets Management Sytem) හඳුන්වාදී තිබෙනවා. එමගින් පළාත් සභා වත්කම් කළමනාකරණයේ කාර්යක්ෂමතාවයක් ඇතිවී තිබෙනවා. මේ නිසා ලංකාවේ ප්‍රථම වතාවට උපචිත පදනම මත (Accrual Basis) ගිණුම් සකස් කිරීමට අපට හැකි වූ බව මා සතුටින් ප්‍රකාශ කරන්න කැමතියි. තවදුරටත් මෙම වත්කම් කළමනාකරණ මෘදුකාංගය තොරතුරු පද්ධතියක් වශයෙන් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වෙනවා.

25.4 ගරු සභාපතිතුමනි, යහපාලනය සඳහා අභ්‍යන්තර විගණනය අත්‍යාවශ්‍ය අංගයක් වෙනවා. සංවර්ධන කාර්යයෙහිදී කළමනාකරණය විසින් ගන්නා ලද තීරණ වල සඵලදායිත්වය පිළිබඳ ඇගයීමක් අභ්‍යන්තර විගණනය තුළින් කිරීමට මා අදහස් කරනවා. මා මුදල් අමාත්‍ය ධුරයේ රාජකාරී භාරගන්නා විට අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටු කිරීම සඳහා අනුමතව තිබුණේ නිලධාරීන් දෙදෙනකු පමණයි.

කළමනාකරණ දෙපාර්තමේන්තුවසමඟ සාකච්ජා කොට එම සංඛ්‍යාව විසිපහ (25) දක්වා වැඩි කර ගැනීමට හැකිවූ බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නේ ඉතාම සතුටිනි.

## 25.5 ඉදිකිරීම් කළමනාකරණය

25.5.1 පළාත් සභාවේ ඉදිකිරීම් කටයුතුවලට අදාළ සැලසුම් සකස් කිරීම, ප්‍රමාණපත්‍ර සකස් කිරීම සහ ගිවිසුම්ගත වීම විවිධ දෙපාර්තමේන්තු තුළ තිබෙන ඉංජිනේරු ඒකක මගින් ඉටු කිරීම දැනට පවතින ක්‍රමය වනවා. මේ නිසා සමහර ඒකක වලට අධික වැඩ කොටසක් පැවරී තිබෙන අතර, සමහර ඒකක වලට ප්‍රමාණවත් වැඩ කොටසක් පැවරී නෑ. මේ නිසා දෙපාර්තමේන්තු ප්‍රධානීන් යටතේ වන සියළුම ඉංජිනේරුවරුන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) යටතට පත්කර ගුණාත්මක ඉංජිනේරු සේවාවක් පළාත තුළ ඇති කිරීමට මා අදහස් කරනවා.

25.5.2 පළාතේ ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය අඩුවීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ පෞද්ගලික ව්‍යවසායකයන් විසින් යොදා ගන්නාවඩු සහ පෙදරේරු කාර්මිකයන්ගේ දැනුම හා කුසලතාවය අඩුකමයි. මේ නිසා ඉදිකිරීම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පෞද්ගලික ඉදිකිරීම් කර්මාන්තකරුවන් යටතේ සේවය කරන වඩු සහ පෙදරේරු කාර්මිකයන් පුහුණු කිරීම කළයුතුයැයි මා යෝජනා කරනවා. මේ සඳහා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට වගකීම පවරන අතර, ඊට අවශ්‍ය ප්‍රතිපාදන පළාත් සභා පුහුණු ව්‍යාපෘතිය යටතේ වෙන් කිරීමට කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, මෙතෙක්වේලා මා මේ ගරු සභාවට ඉදිරිපත් කළේ දෙදහස් දහසය (2016)වර්ෂය වෙනුවෙන් පළාතේ තුළිත සංවර්ධනයක් ඇති කිරීම සඳහාත්, ජනතාවගේ ආර්ථික සහ සාමාජීය විමෙතාවයන් අවම කිරීම සඳහාත් දෙදහස් දහසය (2016) වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති යෝජනායි. එම යෝජනා ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීමේදී කෙටුම්පත් මුදල්

ප්‍රකාශයේ රෝම ඉලක්කම් දහඅට (xviii) හා රෝම ඉලක්කම් දහ නවය (xix) පිටුවල සඳහන් රජයෙන් ලැබීමට නියමිත ප්‍රදානයන්ගේ උප වැඩසටහන්වල ඇතිවූ සංශෝධනයන් අනුවසකස් කරන ලද සාරාංශය සභාගත කරමි. ඒ අනුව මවිසින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මුළු පුනරාවර්තන වියදම් වශයෙන් රුපියල් මිලියන දහසය දහස් නවසිය දාහතරයි දශම පහයි තුනක්ද (රු.මි.16,914.53) මූලධන වියදම් වශයෙන් රුපියල් මිලියන පන්දහස් තුන්සිය අසූ දෙකයි දශම දෙකක් දෙකක් (රු.මි.5,382.22) වශයෙන් රුපියල් මිලියන විසි දෙදහස් දෙසිය අනු හයයි දශම හතයි පහක (රු.මි.22,296.75) ප්‍රතිපාදන දෙදහස් දහසය(2016) වර්ෂය වෙනුවෙන් වෙන් කරනු ලබනවා. පුනරාවර්තන වියදම සඳහා වෙන් කරන ප්‍රතිපාදනය මුළු වියදමෙන් සියයට හැත්තැතුනයි දශම දෙකයි නවයක් (73.29%) වෙනවා.මූලධන වියදම මුළු වියදමෙන් සියයට විසිතුනයි දශම තුනයි එකක් (23.31%) වෙනවා. පළාත්රාජ්‍ය නිලධාරින්ටසහ වාණිජ අත්තිකාරම් ගිණුම් කාර්යයන් මෙහෙයවීම සඳහා රුපියල් මිලියන හත්සිය අසූහතරක් (රු.මි.784) වෙන් වෙනවා. එය මුළු වියදමෙන් සියයට තුනයි දශම හතරක් (3.4%) වෙනවා.

ගරු සභාපතිතුමනි, දෙදහස් දහසය (2016) වර්ෂයේදී ඇස්තමේන්තු කරන ලද මුළු වියදම් පියවා ගැනීම සඳහා සාමූහික ප්‍රදාන යටතේ රුපියල් මිලියන දොළොස්දහස් අටසිය තිස් අටයි දශම නවයයි හයයි පහක් (රු.මි.12,838.965) වෙන්වී තිබෙන අතර, එය මුළු ලැබීම් වලින් සියයට හැට එකයි දශම එකයි නවයක් (61.19%) වෙනවා. උපමානපාදක ප්‍රදාන යටතේ රුපියල් මිලියන හාරසීයක් (රු.මි.400)වෙන්වී තිබෙනවා. එය මුළු ලැබීම් වලින් සියයට එකයි දශම නවයයි එකක් (1.91%) වෙනවා.පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලැබීමට නියමිත ප්‍රදානය රුපියල් මිලියන දෙදහස් අටසිය තිස් අටක් (රු.මි.2,838) වෙනවා. එය මුළු ලැබීම් වලින් සියයට දහතුනයි දශම පහයි තුනක (13.53%) අගයක් ගන්නවා. දැනුම කේන්ද්‍රයේ පදනම මත අධ්‍යාපන පද්ධතිය නිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ රුපියල් මිලියන තුන්සිය අනූවක්ද (රු.මි.390) සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන තුන්සිය හැටපහක්ද (රු.මි.365) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල යටතේ රුපියල් මිලියන එකයි දශම එකක්ද (රු.මි.1.1) උතුරු පළාත මාර්ග සම්බන්ධ කිරීමේව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන හාරසිය හැත්තෑවයි දශම අටයි දෙකක්ද (රු.මි.470.82) වශයෙන් රුපියල් මිලියන එක්දහස් දෙසිය විසි හයයි දශම නවයයි දෙකක(රු.මි.1,226.92) විදේශ ආධාර ප්‍රදානයන් ලබාදීමට

නියමිතව තිබෙනවා. එය මුළු ප්‍රදානයන්ගෙන්සියයට පහයි දශම අටයි හතරක් (5.84%)වෙනවා. ඊට අමතරවසමබර ප්‍රාදේශීය සංවර්ධනය සඳහාවූ ඒකාබද්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන පහළොවක්ද (රු.මි.15) පසුගාමී සංවර්ධන ගම්මාන සංවර්ධනය සඳහා රුපියල් මිලියන අනූවක්ද (රු.මි.90) විවල්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන දහයක්ද (රු.මි.10) වශයෙන් රුපියල් මිලියන එකසිය පහළොවක්ද (රු.මි.115) වෙන්වී තිබෙනවා. මෙම විශේෂ ව්‍යාපෘති යටතේ වෙන්වී ඇති ප්‍රතිපාදන වලට අදාළ ව්‍යාපෘතීන් හඳුනාගෙන අනුමත කර ප්‍රතිපාදන වෙන්කර දෙන තෙක් පළාත් භාණ්ඩගාරයේ අංක 661 ශීර්ෂයේ අංක 04 අයවැය සහය සේවා ව්‍යාපෘතියේ දෙදහස් පන්සිය දෙක(2502) ආයෝජන වැය විෂය යටතේ වෙන් කර තිබෙනවා. ඊට අමතරව රේඛීය අමාත්‍යාංශවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් වර්ෂය තුළදී රුපියල් මිලියන සියයක (රු.මි.100) ලැබීම් අපේක්ෂා කරනවා. එම ප්‍රතිපාදනයද අයවැය සහය සේවා වැය විෂය යටතේ වෙන් කර තිබෙනවා. එසේම දෙදහස් දහසය මුදල් ප්‍රකාශයේ xiv පිටුවේ (ද) ඡේදයේ සඳහන් අයවැය සහය සේවා යටතේ විස්තර කර ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට කල්තියා ඇස්තමේන්තු කළ නොහැකි නමුත් අදාළ මුදල් වර්ෂයේදී අත්‍යාවශ්‍යයෙන්ම කළ යුතු කාර්යයන් කල් දැමීමකින් තොරව අප්‍රමාදව කිරීම සඳහා සංචිත ප්‍රතිපාදනයක් වශයෙන් පළාත් භාණ්ඩාගාරයේ අංක හතර (04) අයවැය සහය සේවා ව්‍යාපෘතියේ දක්වා තිබෙනවා. එසේ වෙන් කරන ලද ප්‍රතිපාදනවලට අදාළ ව්‍යාපෘති හඳුනා ගැනීමෙන් අනතුරුව අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවලට ප්‍රතිපාදන වෙන් කළ පසු විසර්ජන ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි වෙන් කරන ලද මුදල් පිළිබඳ වාර්තාවක් මෙම ගරු පළාත් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.පළාත් සභාවේ ආදායම් වශයෙන් රුපියල් මිලියන දෙදහස් නවසිය හැත්තෑ පහක් (රු.මි.2,975) අපේක්ෂාකරන අතර, එය මුළු ලැබීම් වලින් සියයට දාහතරයි දශම හයයි හයක් (14.66%) වෙනවා. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් වලින් අපේක්ෂිත ලැබීම් රුපියල් මිලියන හයසිය එකයි දශම හතයි තුනක් (රු.මි.601.73) වන අතර, එය සියයට දෙකයි දශම අටයි හතක් (2.87%) වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ අනුව පළාත් සභාවේ දෙදහස් දහසය (2016) වර්ෂය වෙනුවෙන් මුළු වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන විසිතුන්දහස් අසූවයි දශම හතයි පහක් (රු.මි.23,080.75) වෙනවා. මුළු ලැබීම් ඇස්තමේන්තුව රුපියල් විසිදහස් නවසිය අසූවයි දශම නවයයි එකයි හතක්

(රු.මි.20,980.917) වෙනවා. මුළු ලැබීම් ඇස්තමේන්තුවෙන් මුළු වියදම් ඇස්තමේන්තුව අඩුකළ පසු රුපියල් මිලියන දෙදහස් අනූනවයයිදශම අටයි තුනයි තුනක(රු.මි.2,099.833) අයවැය හිඟයක් බලාපොරොත්තු වෙනවා. මෙම අයවැය හිඟයෙන් කොටසක් රජයේ නිලධාරීන් පළාතෙන් බැහැරට ස්ථානමාරුවීයාම නිසා මෙම පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂ වලින් පියවාගැනිමට බලාපොරොත්තු වනවා. එය සාමාන්‍යයෙන් රුපියල් මිලියන විසිපහක්(රු.මි.25.0) පමණ අපේක්ෂා කළහැකියි. රුපියල් මිලියන දෙදාස් හැත්තෑ හතරයි දශම අටයි තුනයි තුනක (රු.මි.2,074.833) පමණ අයවැය හිඟයක් මධ්‍යම රජයේ අතිරේක ප්‍රතිපාදනයක් ලබාගෙන පියවා ගැනීමට මා බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව මා දැනටමත් මුදල් අමාත්‍යාංශය සහ මුදල් කොමිෂන් සභාවසමඟ සාකච්ඡා කර ඇති අතර, එය දෙදහස් දහසය (2016) වර්ෂයේදී ලබාදීමට එකඟත්වය පළ කලා. ඒ අනුව දෙදහස් දහසය(2016)වර්ෂය වෙනුවෙන් මා විසින් මෙම මුදල් ප්‍රකාශය ගරු සභාවේ සම්මතය සඳහා ඉදිරිපත් කරනු ලබනවා.

ගරු සභාපතිතුමනි, මෙම අයවැය සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී සහය ලබාදුන් සියළු දෙනාට ස්තුති කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. මෙම අයවැය මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබාදුන් ගරු ආණ්ඩුකාරතුමාටත්, ගරු සභාපතිතුමා ඇතුළු පළාත් සභාවේ සියළුම අමාත්‍යවරු ඇතුළු මන්ත්‍රීවරුන්ට මාගේ ස්තුතිය පුදකරනවා. එමෙන්ම මෙම අයවැය සකස් කිරීම සඳහා සහාය ලබාදුන් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියළු නිලධාරීන්ට මාගේ ස්තුතිය පුද කරමින් උතුරු මැද පළාතේ ජනතාවටත් ඔබ සියළු දෙනාටමත් ලබන්නා වූ නවවසර ජය සිරි මඟ බෝ සමිඳු පිහිටෙන් සියළු සිතුම් පැතුම් ඉටුවන සෞභාග්‍යමත් නවවසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා

ස්තුතියි !!!!!!